

# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2561 ඇසළ මස 08 වන ශනි දින ■ 2017 ජූලි මස 08 වැනි සෙනසුරාදා




■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# ඇසළ පුන් පොහොය දිනයේ වැදගත්කම

බෞද්ධ ලෝකයාගේ ශ්‍රේෂ්ඨතම දිනය වෙසක් දිනයයි. බුදුරජාණන් වහන්සේගේ තෙමගුල සිදු වූයේ එදිනය. අවබෝධ කරගත් ඒ ධර්මය ලෝකයාට බෙදා දීම ඇරඹුවේ ඇසළ පොහෝ දින හෙයින් වෙසක් පොහෝ දිනට පමණක් මෙය දෙවැනි වේ. පුවසළ සහ උතුරුසළ යන නැකැත් දෙකෙන් එකකදී සඳ පිරෙන පෝය ඇසළ පෝය වශයෙන් නම් කර ඇත. ශාසනික වශයෙන් මෙම දිනයේ වැදගත් සිදුවීම් රාශියක්ම සිදුවී ඇති බව සඳහන්ය.

සිදුහත් කුමරු මව්කුස පිළිසිඳීම, ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම, කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් වීම, භික්ෂූන් වහන්සේලා පෙරවස් එළඹීම, රාහුල කුමාරයාගේ උපත, ලක්දිව අරිට්ඨ කුමරු ප්‍රමුඛ සිංහලයන් 56 දෙනෙකු මහණ උපසම්පදාව ලැබීම, කීර්ති ශ්‍රී රාජසිංහ රජු සියම් රටින් උපාලි තෙරුන් ප්‍රධාන සංඝයා වහන්සේලා ගෙන්වා බු.ව. 2296 දී උපසම්පදාව ඇති කිරීම ඉන් කිහිපයකි.

ඇසළ උත්සවයේ ආරම්භය ඉන්දියාවේ බුදු සමය පහළවීමටත් පෙර කාලය දක්වා විහිදෙයි. බෞද්ධ සාහිත්‍යයේ එන 'ගිරග්ග සමජ්ජ' නම් උත්සවයක් මෙහි ආරම්භය ලෙස සමහරු දක්වති. ජෛන හා හින්දු අනුගාමිකයන් ඇසළට දෙන්නේ උදාරවූත්, ප්‍රබුද්ධවූත් අනුස්මෘතියකි. දේව පූජා මුල් කරගෙන මෙම උත්සවය අවුරුදු පතා පැවැත්වූ බව පැහැදිලිය.

බෞද්ධ සාහිත්‍යයේ දී ඇසළ උළෙල පිළිබඳ තොරතුරු අප දකින්නේ බුදු උපතින් දස මසකට උඩදී එනම්, මව්කුස තුළ පිළිසිඳ ගැනීමත් සමඟය. මහාමායා දේවිය එදා පැවති ඇදහීම් අනුව පෙහෙවස් සමාදන් වී රාත්‍රියේ නිදිගත් අවස්ථාවේ සුදු ඇත් පැටවෙකු කුස තුළට පිවිසෙන ආකාරය සිහිනෙන් දුටු බවත්, බෝධිසත්ත්වයන් ප්‍රතිසන්ධිය ලබා ගන්නේ එම අවස්ථාවේ බවත් බුද්ධ චරිතයේ සඳහන්ය.

සිදුහත් කුමාරයාණන් ගිහිගෙය හැරදමා ගොස් මහණ දම් පිරීම (අභිනිෂ්ක්‍රමණය) ආරම්භ කළේද ඇසළ පොහොය දිනයකය. සියලු සැප සම්පත් හැර දමා ඒ ගිය ගමන සකල සත්ත්වයාගේම යහපත උදෙසා ගිය ගමනක් බව පෙනේ. රාහුල කුමරුගේ උත්පත්තිය සිදුවන්නේද එදිනය. ''මහා වීරය නොයනු මැන. මේ තාක් සිට සත් සත් දිනක් ගිය තැන ඒකාන්තයෙන්ම ඔබට සක්විති රජකම හිමිවෙනු ඇත.'' යනුවෙන් වසවත් මාරයා පවසද්දී සිදුහත් කුමරා සියලු දැ හැර දමා තම ගමන ඉදිරියට ගියේය.

ඇසළ පෝදා සිදුවූ තවත් විශේෂ සිදුවීමක් නම් බුද්ධත්වයෙන් පසු ප්‍රථම වතාවට බුදුරජාණන් වහන්සේ පස්වග තවුසනට දහම් දෙසීමයි. එය ධම්සක් පැවතුම් සූත්‍රය නම් වෙයි. බුදුරජාණන් වහන්සේ සෑම විටම ආදර්ශවත් වූහ. කෘතගුණවේදී වූහ. බුද්ධත්වයෙන් පසු ප්‍රථම වරට දහම් දෙසිය යුත්තේ කාටදැයි කල්පනා කළහ. තමන්ට ගුරු වූ ආලාර කාලාම, උද්දකරාම පුත්ත, භාග්ගව යන ධ්‍යානලාභීන් පිළිබඳ සොයා බැලූවද, ඒ වන විට ඔවුන් ජීවත්ව නොසිටි නිසා තමන් ඇසුරු කළ තමන්වහන්සේ සය අවුරුද්දක් දුෂ්කරක්‍රියා කළ අවධියේදී ආධාර උපකාර කළ පසුවග තවුසනට දහම් දෙසීම සුදුසු යැයි සිතූහ. ඒ වන විට ඔවුහු බරණැස ඉසිපතනයේ මිගදායේ සිටින බව දැන බුදුරජාණන් වහන්සේ බරණැස බලා ගමන් ගත්හ. උපක ආජීවකයන් බුදුරජාණන් වහන්සේට මුණ ගැසුනේද ඒ අවස්ථාවේදීය.

තම අසපුව දෙසට වඩින බුදුරජාණන් වහන්සේ දුටු පස්වග තවුසෝ උන්වහන්සේ බුදු වූ බව නොදැන 'සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළත්, බුදුවන්නට නොහැකිව ඔහු නැවතත් අප කරා එන්නේය. අපි ඔහු නොසලකා හරිමු. ශාක්‍ය වංශික කුමරු නිසා අසුන්ගන්නට පමණක් ඉඩදෙමු' යැයි කතිකා කර ගත්හ. තවුසනට තමන් ඇතිකරගත් කතිකාවෙහි එලෙසින්ම පිහිටා සිටින්නට නොහැකි විය. බුදුරජාණන් වහන්සේ පුහුණු කරන ලද මෛත්‍රී පාරමී ගුණය ඊට වඩා ප්‍රබල විය. ඔවුන් අතුරෙන් කෙනෙක් පෙර ගමන් කර පාත්‍රය පිළිගත් අතර තව කෙනෙක් සිවුරු ගත්හ. තව තවුසෙක් පා දෝවනයට දිය ගෙන ආහ. තව කෙනෙක් අසුන් පැනවූහ. පස්වග තවුසන් විසින් බුදුරජාණන් වහන්සේ පිළි ගැනීම පිළිබඳ ඓතිහාසික කතා පුවත සාරානාත්හි විසිතුරු කැටයමකින් ද දක්වා ඇත.

බුදුරජාණන් වහන්සේට තමන් බුදු වූ බව පස්වග තවුසනට අවබෝධ කරවීමට සෑහෙන වෙහෙසක් දරන්නට සිදුවිය. අන්තිමේදී තවුසෝ සිද්ධාර්ථ ගෞතමයන් බුද්ධත්වයට පැමිණ සිටින බව අවබෝධ කරගත්හ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇසීමට කැමැත්ත පළ කළහ. දම්සක් පැවතුම් සූත්‍රයේ සාරාංශය නම් තමන් වහන්සේ පටන්ගත් මාර්ගය විස්තර කිරීමයි. කාමසුකල්ලිකානුයෝගය (කයට සැප දී විමුක්තිය සෙවීම), අත්තකිලමතානු යෝගය (කයට දුක්දී විමුක්තිය සෙවීම) උන්වහන්සේගේ මාර්ගය නොවන බවත්, මධ්‍යම ප්‍රතිපදාව නියම මාර්ගය බවත් එහිදී පෙන්වා දුන්හ.


මීට අතිරේකව බුද්ධ චරිතයේ තවත් අවස්ථා තුනකදීම ඇසළ පෝය මුල් වූ බව සඳහන්ය. ඉන් එකක් වන්නේ පළමු වස් විසීමයි. බුද්ධත්වයට පත්වී පළමු වස තුළ වස් විසීමක් සිදු නොවූ අතර වැසි කාලයේ භික්ෂූන් වහන්සේලාට විඳින්නට වූ කරදර සලකා බුදුරජාණන් වහන්සේ වස්සාන කාලයේ වස් විසීම අනුදැන වදාළහ. එය සිදු වී ඇත්තේද ඇසළ පෝය පසුවී අවපෑලවිය දිනයේදීය.

සවන්යා ගෞරවී ගුණසේකර

''මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''

# කල්පයක් වැඩ සිටීමට හැකියාව තිබියදීත් බුදු රජුන් එසේ නොකළේ ඇයි?

## අංගුත්තර නිකායේ භූමිචාල සූත්‍රය ඇසුරෙන් ඊට පිළිතුරු සොයමු




එක් දිනක් අපේ බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර මහාවන කූටාගාර ශාලාවේ වැඩ වාසය කළ සේක. එදින බුදුරජාණන් වහන්සේ පෙරවරු කාලයේ පිණ්ඩපාතයේ ගොස් නැවත විහාරයට පැමිණ ආනන්ද තෙරුන් වහන්සේ අමතා ''ආනන්ද, දිවා ආහාරය සඳහා අපි චාපාල චෛතියට යමු... නිසි දානය ගන්නැයි'' වදාළහ. එවිට ආනන්ද හාමුදුරුවෝ ''එසේය ස්වාමීනි'' යැයි පිළිතුරු දෙමින් නිසි දානයද රැගෙන භාග්‍යවතුන් පසු පසින් ගමන් කළේය. බුදුරජාණන් වහන්සේ චාපාල චෛතිය සමීපයට වැඩම කොට ආනන්ද හිමියන් විසින් පනවා දුන් ආසනයේ වැඩ හිඳ ''ආනන්ද වේසාලිය රමණීයයි. උදේන චෛතිය, ගෝතමක චෛතිය, සත්තම්බ චෛතිය, බහු පුත්තක චෛතිය, සාරන්ද චෛතිය, චාපාල ආදී චෛතියන් රමණීයයි'' යනුවෙන් බුදුරදුන් ප්‍රකාශ කළේය.

''ආනන්ද, කවුරුන් හෝ සතර ඍද්ධිපාද දියුණු කරන ලද නම්, බහුල කරන ලද නම්, කැමැති නම් ඔහුට කල්පයක් හෝ කල්පයට ටිකක් වැඩියෙනුත් මේ ලෝකයේ සිටිය හැකියි. ආනන්ද තථාගතයන් වහන්සේ විසින් ඍද්ධිපාද වඩන ලදී. බහුල කරන ලදී. තථාගතයන් වහන්සේ කැමැති නම් කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ වැඩ සිටිය හැකියි.''

අපේ බුදුරජාණන් වහන්සේ විසින් මේ ආකාරයට විවිධ නිමිති ආලෝක දක්වන විටත් එය කුමක්දැයි තේරුම් ගැනීමට ආනන්ද තෙරුන් අසමත් වූහ. මාරාවේශයෙකු මෙන් සිටි ආනන්ද තෙරුන් වහන්සේට ''භාග්‍යවතුන්

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



වහන්ස, බහුජන හිත පිණිස, බහුජන සැප පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, කල්පයක් ජීවත් වනු මැනවි'' යනුවෙන් බුදුන් වහන්සේට ආයාචනා කිරීමට නොහැකි විය. බුදුරදුන් උක්ත කරුණුම අවස්ථා තුනකදී ප්‍රකාශ කළහ.

ආනන්ද හිමියන්ද එම අවස්ථා තුනේම කල්පයක් ඉන්නා ලෙස ආයාචනා නොකළේය. මෙය සිදුවීමෙන් පසුව බුදුන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට ''ආනන්ද දූන් ඔබ යන්න කල් බලන්න'' යැයි වදාළහ. ''ස්වාමීනි, එහෙමයි'' කියා පිළිතුරු දුන් ආනන්ද හාමුදුරුවෝ බුදුන් වහන්සේට වැඳ ළඟම තිබූ එක් ගසක් යටට ගියේය.

ආනන්ද හිමියන් මෙසේ ගිය විටම පාපී මාරයා බුදුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීය. ''භාග්‍යවතුන් වහන්ස, පිරිනිවන් පානු මැනවි. දූන් පිරිනිවනට කාලයයි. ස්වාමීනි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වන ඔබවහන්සේ මා හට මෙසේ ප්‍රකාශ කළා නේද? එනම් මාරය, මාගේ භික්ෂු ශ්‍රාවකයන් ව්‍යක්ත, විනීත, විශාරදව, බහුශ්‍රැතව, ධර්මධරව, ධර්මානු ධර්ම ප්‍රතිපන්නව, ස්වකීය ආචාර්ය ධර්ම ඉගෙන කියන, දෙසන, පිනවන, විවරණය කරන, බෙදා දක්වන, පැහැදිලි කරන පිරිසක් වනතුරු, හේතුඵල ධර්මය දේශනා කරන තුරු මම පිරිනිවන් නොපාමි කියා ප්‍රකාශ කළා නේද?''

''ස්වාමීනි, දූන් ඔබවහන්සේ හිතූ ලෙසම තම ශ්‍රාවක පිරිස විනීත, විශාරද, බහුශ්‍රැත ආදියට පත්ව ඇති බැවින් දූන් පිරිනිවන් පෑමට සුදුසුම කාලය පැමිණ ඇත'' යනුවෙන් බුදුන් වහන්සේට මාරයා ප්‍රකාශ කරනු ලැබීය.

''ස්වාමීනි, ඔබවහන්සේ විසින් මට මෙසේත් කියා තිබෙනවා නේද? එනම් මාරය, මාගේ උපාසක උපාසිකාවන් ධර්ම දේශනා කරන තුරු මම පිරිනිවන් නොපාමි කීවා නේද? දූන් ඔවුන් එම තත්ත්වයට පත්ව තිබේ. බ්‍රහ්මචරියාව, සමෘද්ධිමත්ව පැතිරී බොහෝ දෙනා අතර ප්‍රකටව, පුළුල්ව, දෙව් මිනිසුන් අතර පැතිරෙන තුරු පිරිනිවන් නොපාමි කියා ප්‍රකාශ කළා නේද? ස්වාමීනි, දූන් පැතිර ඇත. පිරිනිවන් පානු මැනවි. දූන් ඔබවහන්සේට පිරිනිවන් පෑමට කාලයයි.''

ඉන්පසු පාපී මාරයාට බුදුරදුන් විසින් මෙසේ ප්‍රකාශ කරනු ලැබූහ. එනම් ''පාපී මාරය, ඔබ වෙහෙසෙන්නට එපා. ඉක්මනින් තථාගත පරිනිර්වාණය වෙනවා ඇති.'' මෙයින් මතු තුන් මසක්ව ගතවූ පසු පිරිනිවන් පාන බව බුදුරදුන් මාරයාට ප්‍රකාශ කළහ. මෙසේ ප්‍රකාශ කොට අප බුදුරජාණන් වහන්සේ චාපාල චේතියෙහිදී සිහි නුවණින් යුතුව ආයු සංස්කාර අත් හැරියේය. ඒත් සමගම මහ පොළොව කම්පාවට පත්විය. අකල් මේඝ ගර්ජන, හෙණ පිපිරීම් සහිත මහ වැසි වැසීමට පටන් ගත් බව වැඩිදුරටත් එම සූත්‍රයේ සඳහන් වේ. ඉන්පසු ආයු සංස්කාර උදානයද ප්‍රකාශ කොට අවසන් කළහ. ගස යට සිටි ආනන්ද තෙරුන්ට මෙසේ සිතිණි. 'අද පොළොව ඉතා බිහිසුණු ලෙස කම්පාවට පත්වුණා. අකාලයේ බිය ගෙන දෙන ගර්ජනා සහිත මහ වැසි වැස්සේ කුමක් නිසාදැයි' සිතුණා. ඉන්පසු ආනන්ද තෙරුන් එසේ වීමට හේතුව කුමක්දැයි බුදුරදුන්ගෙන් විමසීය.

ඊට පිළිතුරු දුන් බුදුන් වහන්සේ මහා භූමි කම්පාවට හේතුවන කරුණු අටක් ඇති බව ප්‍රකාශ කළේය. එනම් මේ මහ පොළොව දියෙහි පිහිටා තිබේ. වතුර පිහිටා ඇත්තේ වාතයෙහිය. වාතය ආකාශස්ථයි. ආනන්ද, සමහර විට මහා වාත හමන අවස්ථා ඇතිවෙයි. එසේ හමන වාතයෙන් ජලය කම්පා වෙයි. ජලය කම්පා වීමෙන් පොළොව කම්පා වෙයි. මහා භූමි චලනයක් වීමට හේතුවයි. අනික් එක ආනන්ද, සෘද්ධි ඇතිව චිත්තවශියට පැමිණි ශ්‍රමණයකු හෝ බමුණකු හෝ දෙවියෙක් සිටියි. ඔහු පඨවි සංඥාව ස්වල්ප වශයෙන් හෝ වර්ධනය කරන ලද්දේ වෙයි. ආපෝ සංඥාව මහත් ලෙස වඩන ලද්දේ වෙයි. ඔහු පොළොව කම්පා කරවයි. ප්‍රකම්පා කරවයි. මෙය මහා භූමි චලනයක් ඇතිවීමට දෙවන හේතුවයි.


තුන්වන හේතුව නම් යම් දවසක බෝසතුන් තුසිත දෙව් ලොවින් චුතව, සිහියෙන් යුතුව මව් කුසක පිළිසිඳ ගනී නම් එදින මහ පොළොව කම්පා වෙයි. සතරවන හේතුව නම් යම් දිනක බෝසතුන් සිහිනුවණින් යුතුව මව්කුසින් බිහිවෙයි නම් එදාට මේ මහ පොළොව කම්පා වෙයි. මහා භූමි චලනයක් ඇතිවීමට බලපාන පස්වන හේතුව නම් යම් දවසක බෝධිසත්ත්වයන් වහන්සේ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරගනියි නම් එදාටද මහ පොළොව කම්පා වෙයි. භූමි චලනය වීමට බලපාන හයවන හේතුව නම් යම් දවසක බුදුන් වහන්සේ උතුම් ධම්මචක්ක පවත්වනය කරයි නම් එදාටද මහ පොළොව කම්පා වෙයි. මෙයට පසු ආනන්ද, යම් දවසක බුදුන් වහන්සේ ආයු සංස්කාර අත්හරියි නම් එදාටද මහ පොළොව කම්පා වෙයි. මෙය භූමි චලනය ඇතිවීමට බලපාන සත්වන හේතුවයි.

මහා භූමි චලනයක් වීමට බලපාන අවසන් අටවන හේතුව නම් යම් දවසක බුදුන් වහන්සේ අනුපදිසේස නිබ්බාන ධාතුවෙන් පිරිනිවන් පානු ලබයි නම් එදාටද මහ පොළොව කම්පා වෙයි, ප්‍රකම්පා වෙයි. සංප්‍රකම්පා වෙයි යනුවෙන් ආනන්ද හිමියන් මහ පොළොව කම්පා වීමට හේතු විමසූ විට මෙම කරුණු අට බුදුරදුන් විසින් ප්‍රකාශ කරන ලදී. මෙමගින් අපට පැහැදිලි වන්නේ භූමිචාල සූත්‍රය තුළින් ඉතා වැදගත් තොරතුරු රැසක් අනාවරණය වන බවයි.

**පූජ්‍ය මීගලෑවේ නන්දරතන හිමි**

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

# කර්ම විපාක ඔබකරා එන්නේ මේ විදියටයි



### ගරුක කර්ම (ආනන්තරීය කර්ම)

සත්වයා විසින් කරන ලද බලවත්ම කර්මය ඔහුගේ මරණ මොහොතේදී ඉදිරියට පැමිණේ.

### ආසන්න කම්ම

ගරුක කර්මයක් (ආනන්තරීය කර්මයක්) නැතහොත් මරණාසන්න කාලයෙහි සිදුකරන කර්මයක් හෝ සිහි කරන ලද කර්මය හෝ විපාක දෙනු ලැබේ.

### ආචින්න කම්ම

පිළිසිඳ ගැනීමට ගරුක කර්මයක් හෝ ආසන්න කර්මයක් හෝ නොමැති නම්, ජීවිත කාලයෙහි නිතර නිතර බොහෝ කොට පුරුදු කරන ලද කුසල කර්මය හෝ අකුසල කර්මය හෝ ඉදිරියට පැමිණ මතු භවයෙහි ඉපදීම සිදුකරනු ලැබේ.

### කටත්තා කම්ම

ගරුක කර්මයක්ද, ආසන්න කර්මයක්ද, ආචින්න කර්මයක්ද නැති කල්හි කවරදා හෝ කරන ලද දුර්වල කර්මයක් උපකාරයක් වෙයි. එය කුසල් හෝ අකුසල් විය හැකිය. 'කටත්තා' යනු කරන ලද යැයි අරුත් දෙයි.

## සිදුවෙන විපාක අනුව කර්ම

### ජනක කම්ම

මතුයෙහි ඉපැදවීමට යම් කර්මයක් හේතුවේ නම් ඊට 'ජනක කම්ම' යැයි කියනු ලැබේ.

### උපස්ථම්භක කම්ම

ජනක කර්මයටද, ජනක කර්මයාගේ විපාකයටද රැකුල් දීමට ඉදිරිපත් වන කර්මය 'උපස්ථම්භක කම්ම' නම් වෙයි.

### උපපීඩක කම්ම

ජනක කර්මයෙන් හිමිවන සුවදුක් පවත්වාගෙන යාමට ඉඩ නොදී හරස් වන්නේ 'උපපීඩක කම්ම' වෙයි.

### උපඝාතක කම්ම

අකුසල කර්මයක බලයෙන් කුසල කර්මයද, කුසල කර්මයක බලයෙන් අකුසල කර්මයද වනසන කර්මයකි. කර්මයක බලය සපුරා වනසයි.

### සියල්ලක්ම කර්මයෙන් සිදුවේද?

සියල්ලක්ම කර්මයෙන් සිදුවෙතැයි බුදුහු නොදෙසූහ. සෘතු නියමයෙන් සුදුසු කල්හි මල් පිපීම් ආදියත්, බීජ නියමයෙන් බීජයට බඳු ඵල හටගැනීමත්, කර්ම නියමයෙන් කර්මය අනුව විපාක දීමත්, ධර්ම නියමයෙන් (ලෝක ධර්මයෙන්) පොළොව කම්පා වීමත්, චිත්ත නියමයෙන් සිත් ඉපදීමත් සිදුවෙයි.

### සෑම කර්මයකටම විපාක ලැබේද?

සෑම කර්මයකටම විපාක නොලැබේ. ඇතැම් කර්ම අහෝසි වෙයි. අහෝසි කර්මය යටතේ දක්වුණු කරුණු බලන්න. අංගුලිමාල තෙරුන් නිදසුනකි.

### කුසල් කිරීමෙන් අකුසල් යටපත් කළ හැකිද?

කුසලයේ බලයෙන් අකුසලේ ශක්තිය හීන කළ හැකිය. අකුසලයේ බලය සපුරා බිඳ දැමීමටද පිළිවන. කුසලය බලවත් වීමෙන් අකුසල් විපාක දීමට කලක් නොලැබී යයි. එහෙත් ආනන්තරීය අකුසල විපාක නම් වැනසීමට නොහැකිය.

### අකුසල් කිරීමෙන් කුසල් යටපත් කළ හැකිද?


කුසල් විපාකයෙන් අකුසල් විපාක යටපත් කළ හැකිවාක් මෙන්ම අකුසල් විපාකයෙන් කුසල් විපාකද යටපත් කළ හැකිය.

### සැලකිය යුතුයි

ආනන්තරීය කම්ම අනතුරු අත් බවෙහි විපාක දෙන කර්මය කිසිසේත් අහෝසි නොවෙයි. දෙවන අත් බවෙහිදී ඊට විපාක ලැබෙන්නේමය. සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණි පුද්ගලයා ආනන්තරීය කර්ම නොකරයි. කුසල් පක්ෂයෙන් අෂ්ට සමාපත්තියටද, අකුසල පක්ෂයෙන් මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදු සිරුරෙන් ලේ සෙලවීම, සමගි සංඝයා භේද කිරීමද ගැනේ.

පූජ්‍ය යටමලගල සුමනසාර හිමි

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# අදටත් දිවි හිමියෙන් සුරකින දළදා තේවාව හා බැඳුණු ඉපැරණි පුද සිරිත්

සිරිසර සිරිලක කන්ද උඩරට සෙන්කඩගල පුරවර ශ්‍රී දළදා මාලිගාවේ වැඩ සිටින ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ ඉතිහාසය ඉතා දීර්ඝ වන අතර ඉතා විසිතුරු සිද්ධීන්ගෙන් මෙන්ම අසිරිමත් කතාන්දරවලින්ද ඒවා පිරී ඇත.

අනුරාපුරවර ධම්මචක්කගේහ මන්දිරයේ පටන් සෙන්කඩගල පුරවර ශ්‍රී දළදා මාලිගාව දක්වා සියලු රාජධානිවල සුවිශේෂයෙන් නිමවන ලද ගේහ, මන්දිර, මාලිගාවල සත්රුවණින් නිමවන ලද මණ්ඩප, කරඬු, ආසන මත වඩා හිඳුවා මහා සංඝරත්නය, රජ මැති ඇමැතිවරුන්, සිටුවරුන්, මහජනතාව කළ පුද පූජා, ආවතේව පෙරහර, වන්දනාමාන අපමණය. ඒවා ලියා නිම කළ නොහැකි තරමටය.



වර්තමාන ශ්‍රී දළදා මාලිගාවේ තේවා මුරය සිදුකරන්නේ උභය මහා විහාරේ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පත්කරන මහා සංඝරත්නය විසිනි. ශ්‍රී දළදා තේවාව මහා භාරදූර කාර්යයක් වන අතර එය ශ්‍රද්ධාවෙන්, වීර්යයෙන්, වගකීමෙන් සිදුකළ යුතු මහා පින්කමකි.

බෞද්ධයන් ලෙස දළදා තේවාව සම්බන්ධ ඇතැම් කාරණා දැනගෙන තිබීමද ඉතා වැදගත්ය.

1. තේවා මුරය භාරගන්නා මහා සංඝරත්නය
2. රාජකාරි නිලධරයන්
3. තේවාව පිළිබඳ සම්බන්ධ ස්ථාන
4. තේවා භාණ්ඩ
5. තේවාව සිදුකරන පිළිමවල
6. පංච තූර්ය නාද පූජාව
7. බදාදා මංගල්‍යය

අස්ගිරි-මල්වතු උභය මහා විහාරේ මහා සංඝරත්නය වර්ෂයක් පාසා මාරුවෙන් මාරුවට ශ්‍රී දළදා තේවා මුරය බාරගෙන ඉතා ශ්‍රද්ධාවෙන්

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

සිදුකිරීම ශ්‍රී සම්බුද්ධ ශාසනයේ හා බෞද්ධ ශිෂ්ටාචාරයේ පැවැත්මට ප්‍රධාන අනුබලයක් වන්නේය. ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අවසරය පරිදි පස්නමක් තේවාව සඳහා ඇප කැප වෙති.

ඇසළ පුරපසළොස්වක් පෝ දින උපෝසථාගාරවල පෝය කොට පසුදින අපරභාගයේ තේවා මුර බාරගෙන එදින සිට එම පස්නමක් වන මහා සංඝරත්නය දළදා මාලිගාවේ වස් වසා වසර පුරාවට දිනපතා දවසට තෙවරක් තේවා සිදුකරති. ශ්‍රී දළදා තේවාවේ නියුක්ත මහා සංඝරත්නය පිළිපැදිය යුතු, ඉෂ්ට සිද්ධ කළයුතු පැරණි චාරිත්‍ර රාශියක් ඇත. පැරණි රජ දවස පටන් පවත්වාගෙන එන එම උතුම් චාරිත්‍ර ඉතා ශ්‍රද්ධාවෙන් සිදුකරනු ලබන්නේය.

1. තුන් සිවුරෙන් යුක්තව තේවාවට සූදානම් වීම
2. දිනපතා තුන් වරක් පුද පූජා පැවැත්වීම
3. මළ ගෙවල්වල නොයාම.

මේ ආදී ලෙසින් සමාජීය වශයෙන් බහු කාර්යයන්ගෙන් මෙන්ම ශ්‍රී දළදා මාලිගාවේම වැඩ සිට ජීවමාන බුදුරජාණන් වහන්සේට ආනන්ද හිමියන් කළ උපස්ථාන මෙන් සෝළසවිධ උපස්ථාන පූජාවන් සිදු කරන්නට නියමිත වන්නේය. මෙසේ එම මහා සංඝරත්නය ලොව කිසිම බෞද්ධ සිද්ධස්ථානයක සිදු නොකරන උතුම් පූජාමය තේවාවක් සිදු කරන්නට වසර පුරාවට ඇප කැපවී සිටිති.

වර්ෂ 2016 ඇසළ පුරපසළොස්වක් පෝ දිනට පසුදින සවස ශ්‍රී දළදා මාලිගාවේ තේවා මුරය බාරගත් ශ්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක ධූරන්ධර වරකාගොඩ ඥානරතනාභිධාන මාහිමියන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය තේවා මුර කාලය අවසන් කර මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක මාහිමියන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට 2017 ඇසළ පුරපසළොස්වක් පෝ දිනට පසු දින සන්ධ්‍යා භාගයේ ශ්‍රී දළදා මාලිගාවේදී චාරිත්‍රානුකූලව බාර කරනු ලබන්නේය.

ශ්‍රී දළදා මාලිගාවේ සියලු ගොඩනැගිලි මෙන්ම රාජකාරි නිලධරයන්ද වෙන් වන්නේ දළදා තේවාව ප්‍රධාන කරගත් සිරිත් විරිත්, පුද පූජා, වන්දනාමාන සඳහා වන අතර ඒ සඳහා අත්‍යවශ්‍ය උපකරණ තැන්පත් කිරීම හා භාවිතය පිණිසද ස්ථාන නියමිතව ඇත.

1. ගඳ කිළිය - උඩ මාලය
2. පල්ලේ මාලය
3. ගෙපලුම් බරාඳ
4. කත්තිය බරාඳ
5. හඳුන් මණ්ඩපය
6. සළු මණ්ඩපය
7. කවිකාර මඩුව
8. හේවිසි මඩුව
9. මුරායුධ මඩුව
10. මුළුතැන්ගේ
11. දර්ශන මණ්ඩපය.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි දෙව්රම් වෙහෙර ගඳ කිළිය හෙවත් සුගන්ධ වාසිත කුටිය නමින් හැඳින්වූ අතර ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින කරඬුව තැන්පත් කළ කුටියද ගඳකිළිය වශයෙන් ව්‍යවහාර වන්නේය.

බුද්ධ පූජා, ගිලන්පස, මල්, දූහැත්, දූහැටි ආදී සෝළසවිධි පූජා පවත්වන්නේද මෙම අසහාය ගඳකිළිය තුළදීමය. දළදා තේවාවේ නියුක්ත භික්ෂූන් වහන්සේලා හැර වෙනත් කිසිම කෙනකුට එම ගඳකිළියේ රැඳීමට අවසර නැත. සියලු භික්ෂූන් වහන්සේලාද අවසරය පරිදි පටි බැඳ සංවරව ඇතුල් වී වැඳ පුදා වහා පිටවිය යුතු වන්නේය.

රන් පාට පිළිම වහන්සේ හා මැණික් පිළිම වහන්සේ වැඩ සිටින පල්ලේ මාලේද උඩා මාලේ තේවාවන් සිදුකරන වේලාවන්ට සමගාමීව තේවාව සිදුකරන අතර උඩ මාලේ තේවා මුරයට ප්‍රථමයෙන් පුරුදු පුහුණු වන නවක භික්ෂූන් වහන්සේලා මෙහි ආවතේව කරති.

ශ්‍රී දළදා මාලිගාවේ ව්‍යවහාර කරන සුවිශේෂ වචන මාලාවක්ද ඇත. එම භාෂා ව්‍යවහාරයෙන් ආගමික ශ්‍රද්ධාව මෙන්ම රාජකීය බවක්ද සනිටුහන් වන්නේය.



1. පයිණ්ඩ කිරීම
2. මල්බැහැ ගැනීම
3. ආලක්ති බෑම
4. කණ්ඨස්නානය
5. මේ වැඩීම.

ආදී වචන භාවිත කරමින් මහා සංඝරත්නය හා නිලධරයන් නියමිත පුද පූජා පවත්වන විට ආතත, විතත, විතතාතක, ඝණ, සුසිර යන පංචතූර්ය නාද පවත්වන විට, දහස් ගණන් ජනී ජනයා සාධු සාධු නදින් ගාථා කියමින් වඳින පුදන විට නෙත් සිත් ප්‍රබෝධ වන්නේය. ශ්‍රද්ධාවෙන්, සොම්නසින් ඉපිල යන්නේය.

ශ්‍රී දළදා මාලිගාවට පය තැබූ කෙනෙක් කිසි කලෙක දුගතියට නොයන්නේය. සගමොක් සුව ලබන්නේය.

"ලෝකේන නාථ වදනම්බුජ රාජ හංසං
වෙනෙය්‍ය කොමුදවනං කිර ජොතයන් තං
සෙට්ඨං මහග්ඝ වරරූප විරාජමානං
වන්දාමි වාමමලං ජිනදන්ත ධාතුං
සාධු, සාධු, සාධු."

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# හතර කේන්දරේ පාළු නම් මහණ කළ යුතුමද?



ඇත්තටම මහණකම කියන්නේ අනුන්ට සේවයක් කරන්න, තමන්ට විමුක්තිය උදාකරගන්න, ශ්‍රී සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරගන්න ජීවිතය කැප කිරීමක්. ඒත් ඉස්සර කාලේ කොතැනක හරි පොඩි වැරදීමක් වෙලා ඔන්න හතර කේන්දරේ පාළුයි, අන්තිම දරුණු ග්‍රහ අපල තියෙන අයව මහණ කළ යුතුයි කියලා ඇතිවෙච්ච වැරදි සම්මතයක් නිසා තමයි ඔය හතර කේන්දරේ පාළුයි කියලා, මාරක අපල තියෙනවයි කියලා ළමයින්ව පන්සල්වලට පූජා කරන්නේ.

අපි බලමු ඉස්සෙල්ලාම මොකද මේ හතර කේන්දරේ පාළුයි කියන්නේ කියලා. හඳහනේ හතර කේන්දරේ කියන්නේ 1, 4, 7, 10 කියන කොටු හතරට. මේ කොටු හතරෙන් එක (1) කොටුව නැත්නම් ලග්නය කියන්නේ මිනිහෙකුගේ ආත්ම ශක්තිය, ශරීර ශක්තිය, ඉදිරිපත්වීමේ ශක්තිය, පෞරුෂත්වය පෙන්වන කොටුව.

ඉතින් එය පාළු වෙනවා කියන්නේ ඒ කොටුවේ බල අඩුවීම. භික්ෂූන් වහන්සේ කියන්නේ ආත්ම ශක්තියෙන් යුත්, පෞරුෂත්වයෙන් යුත්, නිරෝගී බවෙන් යුත්, ගමක, ප්‍රදේශයක පිරිසකට ප්‍රධානත්වය දෙන පුද්ගලයෙක්. ඉතින් ලග්න කොටුව පාළු නම් ඒ ශක්තීන් මහණකමට සුදුසුකමක්ද?

4 වැන්න කියන්නේ හදවත, සිතීමේ ශක්තිය, මූලික අධ්‍යාපනය, ගෙදර දොර පාලකත්වය. ඉතින් 4 කොටුව පාළු වෙනවා කියන්නේ මේවා දුර්වලවීම. ඒවා මහණකමට සුදුසුකමක්ද?

7 කොටුව කියන්නේ හවුල්කරුවෝ, පිරිස, සහයෝගය දෙන අය, පිරිස් පාලනය, පිරිස් මෙහෙයවීම. ඉතින් 7 පාළු වෙනවා කියන්නේ මේ ස්ථාන දුර්වලවීමක් නේද? භික්ෂූන් වහන්සේ නමකට පිරිස් බලය තිබිය යුතුයි. පිරිසක් මෙහෙයවීමේ ශක්තිය තිබිය යුතුයි. මහජනතාව තමා වෙත ඇදී ආ යුතුයි. ඉතින් මේවා නැතිවිට මහණකමට සුදුසු කමක්ද?

10 වැනි කොටුව කේන්ද්‍රයේ මුදුන් ස්ථානය. තනතුරු, තාන්න මාන්න, තත්ත්වය, ගෞරවාන්විත බව, වැඳුම් පිදුම් ලැබීම, නායකත්වය හා ප්‍රධානත්වය හිමිවීම ප්‍රකාශ කරන තැන. ඉතින් 10 කොටුව පාළු වෙනවා කියන්නේ මේවා අහිමිවීම නේද? ඒවා පාළුවීම මහණකමට සුදුසුකමක්ද?

අන්න එහෙම නම් 4 කේන්දරේ පාළු වෙච්ච, ජීවිතයේ සැප අහිමි වන, ගේ දොර, පිරිවර, තනතුරු අහිමි වන, ලෙඩ දුක් කරදර විපත්තිවලට ගොදුරු වෙන, බාධක, අපල තියෙන අයද ශාසනයේ සුරක්ෂිත භාවයට, ජනතාව යහමග යැවීමට, හොඳ නරක කියා දීමට මහණ කළ යුත්තේ?

බුද්ධිය තියෙන, උසස් අධ්‍යාපනය ලබන්න පුළුවන්, හොඳ පෞරුෂත්වයක් ඇති, තම ධනය, දේපළ වුණත් අනුන්ගේ යහපතට කැප කරන්න පුළුවන්, ධන සම්පත් තියෙන, වැඳුම් පිදුම්, ගරු සම්මාන හිමිවීමේ භාග්‍යය තියෙන ඉතා සුබ, බලවත්, බුද්ධි යෝග, ඥාන යෝග, ධන යෝග හා රාජ යෝග තියෙන අය නේද ශාසන දියුණුව උදෙසා ජනතාවගේ යහපත, යහමග උදෙසා මහණ කළ යුත්තේ?

එසේ නැතිව යම් කෙනෙක් තමන්ට වෙන විපත්තිවලින් මිදෙන්න හෝ ගේ දොර, අධ්‍යාපනය, තනතුරු ලබන්නත් වාසනාව නැති විට එයා සසුන්ගත වෙනවා නම් එහෙම වෙන්නේ, එයා එහෙම කරන්නේ ආත්මාර්ථය තකා නේද? ආත්ම ලාභය තකා නේද?

එහෙම නම් අපේ බුද්ධ ශාසනය ආරක්ෂා කරගන්න, දියුණු කරගන්න, ජනතාවට සේවයක් කරන්න, විමුක්ති මාවත සොයන්න සසුන් ගත විය යුත්තේ සියලු සැප සම්පත්, ධන සම්පත්වලට හිමිකම් කියන වාසනාවන්ත උසස් පවුල්වල අය නේද?

ධනවතුන්, උගතුන් සිය සැප සම්පත් අත්හැරලා සසුන්ගත වේ නම් ආගමත් සුරැකෙනවා, ජනතාවටත් යහපතක් වෙනවා, ඒ අයට විමුක්තිය උදාවෙනවා.


හතර කේන්දරේ පාළු අය මහණ කළ යුතු නම් තුන්ලෝකාග්‍ර බුදු හාමුදුරුවන්ගේ ලග්නය කටකනේ. පළමුවැනි කොටුවේ ගුරු උච්චයි, බලවත්. 4 වැනි කොටුවේ සිකුරු ස්වක්ෂේත්‍රයි, බලවත්. 7 වැනි කොටුවේ කුජ උච්චයි, බලවත්. 10 වැනි කොටුවේ රවි උච්චයි, ඉතා බලවත්.

බලන්නකෝ 4 කේන්ද්‍රයම ඉතා බලවත්. සිද්ධාර්ථ කුමාරයාත් පැවිදි වෙලා, තුන්ලෝකාග්‍ර බුදු පදවිය ලබලා කෝටි සංඛ්‍යාත ජනතාවකට විමුක්තිය සොයා දුන්නේ 4 කේන්ද්‍රය පාළු නිසාද? බලවත් නිසාද?

එහෙම නම් මහණකමට සුදුස්සෝ කේන්ද්‍ර දුබලයෝද? බලවතුන්ද?

**දමිත් දිසානායක**

"දෙවු වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."




# බුදු බව ලැබුවද

# මේ එකොළොස් කර්ම

## උන්වහන්සේ කෙරේ ආවේ මේ නිසයි

1. පෙර මූනාලි නම් දූර්තයෙකුව සරභූ නම් පසේ බුදුරජාණන් වහන්සේට අසත්‍යයෙන් දෝෂාරෝපණය කළ නිසා, කලින් නිරයේ දුක් විඳ බුදු බවට පැමිණද, සුන්දරී පරිබ්‍රාජිකාව මැරීම පිළිබඳව අභූත දෝෂාරෝපණයක් ලැබීම.
2. අභිතු නම් බුදුරජාණන් වහන්සේ නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට බොරුවෙන් චෝදනා කිරීම නිසා අවුරුදු දස දහසක් නිරයේ දුක් විඳ බුදු බවට පැමිණද, කර්මාවශේෂය නිසා චිංචි මානවිකාවන්ගේ අභූත චෝදනාවලට ලක්වීම.
3. පෙර භවයකදී තම පියාගේ වෙනත් භාර්යාවන්ගේ පුත්‍රයකු ධනාශාව නිසා පර්වත දුර්ගයක දමා ගලකින් පොඩි කිරීමේ කර්ම විපාකයේ ශේෂයෙන් දෙව්දත් තෙර ගල් පෙරළීම හා එයින් තමන් වහන්සේගේ මහපටැඟිල්ල තුවාල වීම.
4. පෙර කුඩා ළමයකුට ක්‍රීඩා කරමින් සිටියදී පසේ බුදුරජාණන් වහන්සේ නමක් දූක, උන්වහන්සේ වඩින මාර්ග යෙහි ගල් පතුරක් දූමීම නිසා දෙව්දත් තෙර තමන් වහන්සේ මැරවීමට දුනුවායන් යෙදවීම.
5. පෙර ඇත්ගොව්වෙකුව පිඬු සිඟා වඩින පසේ බුදුරජාණන් වහන්සේ නමකට ඇතු ලවා පීඩා කරවීම නිසා තමන් වහන්සේ මැරවීමට නාලාගිරි ඇතු මෙහෙයවීම.
6. පෙර රජෙකුට සැතකින් ඇන මිනිසෙකු මැරවීම නිසා තමන් වහන්සේගේ උඩු පතුල තුවාල වීම.
7. පෙර කෙවුල් ගමක කුඩා දරුවකුව ඉපිද මරන ලද මාළුවන් දූක සතුටු වීම නිසා පවතින හිසරදයක් ඇතිවීම.
8. ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි "තෙපි, යව අනුභව කරව්, ඇල් සහල් අනුභව නොකරව්" යැයි භික්ෂූන් වහන්සේලාට පරිභව කිරීම නිසා වේරඤ්ජාවේ වස් තෙමස යව අනුභව කරන්ට වීම.
9. මල්ලව පොරයකදී ප්‍රතිමල්ලවයාට පීඩා කිරීම නිසා පිට රිදෙන්නට වීම.
10. පෙර වෙදෙකුව, නොයෙක් වර වෙදකම් කර තමන්ට කිසිවක් නොදුන් සිටු පුත්‍රයකු කෙරෙහි කිපී නැවත රෝගී වූ ඔහුට විෂ බෙහෙතක් දී විරේක කරවීම නිසා ලෝහිත පක්ඛන්දිකා රෝගය වැලඳීම.
11. ජෝතිපාල මානවකව ඉපදී කස්සප බුදුරජාණන් වහන්සේට ගර්හා කරමින් "ඔය මුඩු මහණාට බුද්ධත්වයක් කොයින්ද? එය ඉතා දූර්ලභ එකකැ" යි කීම නිසා සාවුරුද්දක් මුළුල්ලේ දුෂ්කර ක්‍රියා කිරීම.

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."




# නිවන් මගට දොර විවර කරණ ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව



දේශකයාණෝ - මහනුවර හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති, ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති, ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර, අතිගෞරවාර්හ

**වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන**

මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

"ද්වෙ මෙ භික්ඛවෙ, අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා. යොචායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, එතෙ තෙ භික්ඛවෙ, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති."

(සං.නි. පඤ්චම භාගය, දෙවන වර්ගය)

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

පින්වත්නි,


“භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් අමතා හීන වූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන්ට අයත් වූ අනාර්ය, අවැඩදායක, පඤ්චකාම වස්තූන් විෂයෙහි මුලාවට පත් වීම නම් වූ කාමසුඛල්ලිකානුයෝගයත්, දුක් වූ අනාර්ය වූ, අවැඩදායක, ශරීරයට නොයෙක් දුක් දෙන්නා වූ අත්තකිලමථානුයෝගයත්, යන මේ අන්ත දෙක පැවිද්දෙකු විසින් අනුගමනය නොකළ යුතු බවත්, මේ අන්ත දෙකට නොගොස් චතුරාර්ය සත්‍යය, හරි හැටි බලන, ප්‍රඥා චක්ෂුස ඇති කරන, හිතේ හැටි දන්නා ඤාණය ඇති කරන, කෙලෙස් සංසිඳවන, නිවන සාක්ෂාත් කර ගැනීම පිණිස මධ්‍යම ප්‍රතිපදාව පවතින බවත් දක්වා වදාළ සේක. තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කළ ප්‍රඥාව ඇති කරන, නිවන පසක් කරන, මධ්‍යම ප්‍රතිපදාව නම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන ආර්ය අෂ්ටාංගික මාර්ගයමැයි. තථාගතයන් වහන්සේ අවබෝධ කළ ප්‍රඥා චක්ෂුසය, ඤාණය ඇති කරන, මධ්‍යම ප්‍රතිපදාව කෙලෙස් සංසිඳවනු පිණිස නිවන් පසක් කිරීම පිණිස හේතු වන්නේය.”

අප සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණ සත් සතිය ගෙවා අජපල් නුගරුක මුල අටවෙනි සතිය ගෙවමින් වැඩසිටි සේක. එහිදී උන්වහන්සේට මෙබඳු අදහසක් පහළ විය. “මා අවබෝධ කළ චතුරාර්ය සත්‍යය ඉතා ගැඹුරු නිසා අවබෝධයට අපහසුය. සාමාන්‍ය ලෝවැසියා තෘෂ්ණාවෙන් දැවටී මෝහයෙන් පිරී ඇත්තේය. තෘෂ්ණාවෙන් මෝහයෙන් පිරුණු සත්වයාට පටිච්චසමුප්පාදය හා නිවන අවබෝධ කිරීම දුෂ්කරය” යනාදී වශයෙන්, ධර්මයේ ගැඹුරු බව සිතූ කල්හි, එහි පැමිණි සහම්පති මහාබ්‍රහ්මයා ලෝකසත්වයා කෙරෙහි අනුකම්පාවෙන් ධර්මය දේශනා කරන ලෙස හා ලෝක සත්වයා අතර ධර්මය අවබෝධ කරන්නෝ සිටිතියි පැවසූහ. බුදු ඇස යොමු කොට ඤාණ ප්‍රමාණයක් ඇති සත්වයෝ ද ඇති බව දැන, ධර්මය දේශනා කිරීමට කාලය බව් දත්හ. තමන් වහන්සේ නිවන් සොයා යන ගමනේ දී උපකාරී වූ ආලාර කාලාම සහ උද්දකරාම පුත්ත යන අය පළමුව හා දෙවනුව සිහිපත් කොට ඔවුන් ජීවතුන් අතර නොමැති බව දැන, අනතුරුව සය වසරක් තිස්සේ දුෂ්කර ක්‍රියා කළ සමයේ දී තමන් වහන්සේට උපකාරී වූ කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහනාම, අස්සජි යන පස්වග තවුසන් බරණැස ඉසිපතන මිගදායේ සිටින බව දැන ඔවුන් සොයා එහි වැඩම කළ සේක.

බුදුරජාණන් වහන්සේ වැඩම කරනා ආකාරය දුර ඈතදීම දුටු පස්වග තවුසන් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වීර්යයෙන් මිදී කාමසුඛල්ලිකානුයෝගීව සිට දැන් අප කරා එතැයි සිතූහ. පෙර ගමන් නොකිරීමටත් නොවැඳීමටත් උවටැන් නොකිරීමටත් කතිකා කොට, උසස් පවුලක උපන් හෙයින් කැමති නම් අසුන් ගැනීමට අසුනක් පැනවීමට සිතා ගත්හ. බුදුරජාණන් වහන්සේ ළඟා වත්ම කතිකා කරගත් පරිදි ක්‍රියා කිරීමට නොහැකි වූ පස්වග තවුසෝ කෙරුණු පිළිසඳරින් පසු බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ බව දැන ධර්මය ඇසීමට එකඟ වූහ. මිනිසුන් අතුරෙන් පස්වග තවුසන් හා දෙවිබඹුන් සහිත පිරිසක් ඇසළ මස පුනුස්වක දින ප්‍රථම ධර්ම දේශනාව ශ්‍රවණය සඳහා සහභාගි වූහ. මේ ප්‍රථම ධර්ම දේශනාව ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව නම් විය.

ප්‍රතිවේධ ඤාණය, දේශනා ඤාණය යන දෙනුවණ දහම් අවබෝධ කරන්නන්ගේ සිත්හි චක්‍රයක් මෙන් පැවැත්වීම සිතට නැංවීම යන්නෙන්, ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව නම් විය. ධම්ම යනු ඥානයයි. චක්ක යනු පැවැත්මයි. ඥානය චක්‍රාකාරව පැවතීම ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවයි. ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවට අනුව කාමසුඛල්ලිකානුයෝගය ලාමක වූ, ග්‍රාම්‍ය වූ, පංචකාමයේ ඇලීමයි. අත්තකිලමථානුයෝගය නම් අනාර්ය වූ, කෙලෙස් නැසීමට දැඩි දුක් උපදවන්නා වූ දැයෙහි ඇලීමයි. මේ අන්ත දෙකින් මිදී මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපැදීම කෙලෙසුන් නසා සත්‍යාවබෝධය හා නිර්වාණය පිණිස පවතී.

මෙකී චතුරාර්ය සත්‍යයෙහි පළමු සත්‍ය නම් දුකයි. ඒ දුක නම්, ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, පියේහි විප්පයෝගෝ, අප්පියෙහි සම්පයෝගෝ, කැමති දේ නොලැබීමය, සැකෙවින් කියතොත් පංචුපාදනස්කන්ධයම දුකය. ජාති නම් ඉපදීමය. ජරාව නම් ශරීරයේ දිරීමයි. මරණය නම් නාම රූපයන්ගේ බිඳීමයි. ශෝකය නම් ප්‍රිය වස්තු හා ප්‍රිය පුද්ගල විනාශයයි. පරිදේව නම් නෑසියන් ආදීන් වැනසී හැඬීම වැළපීමය. දුක්ඛය නම් ශරීරයේ හටගන්නා වේදනාවෝය. දෝමනස්සය නම් සිතෙහි හටගන්නා දුකය. උපායාසය සිතෙහි හටගන්නා බලවත් ආයාසයයි. පියෙහි විප්පයෝගෝ දුක්ඛො නම් ප්‍රියයන්ගෙන් වෙන්වීමයි. අප්‍රියෙහි සම්පයෝගෝ නම් අප්‍රිය පුද්ගලයන් හා වස්තු හා එක්වීමයි, දැකීමයි. කැමති දේ නොලැබීම, ලැබීමට



කැමති දේ නොලැබීමයි. පංචූපාදස්කන්ධ දුක්ඛය නම් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ යන ස්කන්ධ පහේ දුකයි. සියලු දුක් නැසීමට නම් පළමුව ජාතිය හෙවත් ඉපදීම නැති කර ගත යුතුය.

දුක්ඛ සමුදය සත්‍ය නම් දුකට හේතු වූ කාම, භව, විභව යන තුන් ආකාර තෘෂ්ණාවයි. ඇල්මයි. කාම තණ්හා යනු පසිඳුරන්ගෙන් ලබන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්චකාම ගුණයනහි ඇලෙන තෘෂ්ණාවයි. කාම සුඛය වනාහි අසූචි සුඛය බඳුය. පුහුදුන්, නොසෙවිය යුතු, අනාර්ය සුඛයකි. මෙලොව සැප විඳිය යුතුය යන හැඟීමයි. භව තණ්හාව යනු මේ සැප කිසි දිනක නැති නොවන්නේ යැයි සිතා ශාස්වත දෘෂ්ටි සහගතව හටගන්නා තෘෂ්ණාවයි. විභව තණ්හා යනු මතු උත්පත්තියක් නැත, මේ ජීවිතයෙන් අවසන්ය යන උච්ඡේද දෘෂ්ටි සහගතව හටගන්නා තෘෂ්ණාවයි.

දුක්ඛ නිරෝධය යනු දුක ඉපදීමට හේතුව නම් වූ තෘෂ්ණාවේ නිරෝධයයි. ත්‍රිවිධ තෘෂ්ණාවන් ඉතිරි නොවන සේ හැරලීමයි. දුරලීමයි. මිදීමයි. මාර්ග සත්‍ය යනු දුක්ඛ නිරෝධය හෙවත් නිර්වාණයට පැමිණීමේ මාර්ගයයි. තෘෂ්ණාවේ මුල් සිඳ දමන ධර්මය දුක්ඛනිරෝධගාමිනී පටිපදා මාර්ගයයි.

ඒ නිවනට නොවරදින මග ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. දුකින් මිදීමේ මාර්ගය නිවැරදි දැකීම, නිවැරදි සිතුවිලි, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාව, නිවැරදි ආජීවය, නිවැරදි වෑයම, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේ අටයි. සත්‍ය සතර නම් වූ දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන සතරයි. භාග්‍යවතුන් වහන්සේ මෙම සත්‍ය සතර තිපරිවට්ට ද්වාදසාකාරයෙන් දත යුතු බව වදාළ සේක. දුක්ඛ ආර්ය සත්‍යයේ තිපරිවට්ටය නම් සත්‍ය, කෘත්‍ය, කෘත යනුයි. සත්‍ය නම්, සත්‍යයක් ලෙස අවබෝධ කර ගැනීමයි. කෘත්‍ය නම් කළ යුත්තක් බව පිරිසිඳ දත යුත්තක් බවයි. කෘත නම් කරන ලද පිරිසිඳ දන්නා ලද බවයි. සමුදය ද එසේම තුන් ආකාරය. එහි සත්‍ය නම් සමස්ත ලෝකයම මැනවින් හටගැනීම පිළිබඳ මනා දැක්මයි. කෘත්‍ය නම් තෘෂ්ණාව ප්‍රහීන කළ යුත්තක් බව දැනීමයි. කෘත නම් ප්‍රහීන කළ බවයි. නිරෝධ සත්‍යය ද තුන් ආකාරය. සත්‍ය, කෘත්‍ය, කෘත වශයෙනි. එහි සත්‍ය නම් මූලික අවබෝධයයි. කෘත්‍ය නම් සාක්ෂාත් කළ යුත්තක් බව ප්‍රත්‍යක්ෂ කොට දත යුත්තක් බවයි. කෘත නම් සාක්ෂාත් කර ගන්නා ලද බවයි. මාර්ග සත්‍ය ද සත්‍ය, කෘත්‍ය, කෘත වශයෙන් බෙදේ. එහි සත්‍ය නම් සත්‍යක් ලෙස දැකීමයි. කෘත්‍ය නම් වැඩිය යුත්තක් සේ දැකීමයි. කෘත නම් වඩන ලද බව හෙවත් භාවිත බවයි.

මෙසේ තුන් පැවැත්මක් හා ආකාර දොළහක් ඇති ආර්ය සත්‍ය සතර කෙරෙහි තත්ත්වාවබෝධ ඥානය ලබා ගන්නා ආකාරය දැක්වෙන ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් පසු පස්වග තවුසෝ බලවත් සතුටට පත්වූහ. දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද මහ හඬින් සාධුනාද පැවැත්වූහ. මහපොළොව කම්පා විය. තවත් අසිරිමත් බොහෝ දේ සිදු විය. පළමුව මෙම අසිරිමත් ධර්මය අවබෝධ කොට ගත් කොණ්ඩඤ්ඤ තවුසා, අඤ්ඤා කොණ්ඩඤ්ඤ වශයෙන් ප්‍රකට විය. සෝවාන් ඵලයට පැමිණ එහිභික්ෂු භාවයෙන් පැවිදි උපසම්පදාව ලැබීය. ඉන් අනතුරුව ආයුෂ්මත් වප්ප, භද්දිය යන දෙනම ද, ඉක්බිති ආයුෂ්මත් මහානාම, අස්සජි යන දෙනම ද සෝවාන්ව මහණ උපසම්පදාව ලැබූහ. මෙසේ සෝවාන් වූ පස්වග මහණුන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම විස්තර කෙරෙන අනත්තලක්ඛණ සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් රහත් ඵලයට පැමිණියහ.

මෙම උත්තරීතර චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට සියලු කෙලෙසුන් නසා යළි උපතක් නැති උතුම් නිවන සාක්ෂාත් කර ගැනීමට අපිදු අනලස්ව දිරිමත් වෙමු. තෙරුවන් සරණයි.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

# ගමේ මුදලාලිගේ ධාර්මිකකම බුදු දහම නමැති තරාදියෙන් කිරා බලමුද?



බෞද්ධ සමාජ සංකල්පය අනුව භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව් පිරිස ගිහි හා පැවිදි වශයෙන් ප්‍රධාන දෙපිලකට බෙදෙන බව අපි දනිමු. ඒ අනුව ගිහියන් හා පැවිදි උතුමන්ගේ ජීවිත අරමුණු එකිනෙකට වෙනස්ය. ගිහියන් ලෞකික සුවය අරමුණු කොට ජීවත් වන අතර පැවිදි උතුමන් ආධ්‍යාත්මික සුවය අරමුණ කොට ජීවත් වේ. ගිහි දිවිය හා සැසඳීමේදී පැවිදි දිවියේ ප්‍රධාන අරමුණ විය යුත්තේ නිර්වාණයයි. එහෙත් සංකීර්ණ අරමුණු පදනම්ව ගිහි ජීවිත ගත කිරීමේදී දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට මුදල් ඉපයීමට සිදුවේ. බුදු දහමට අනුව ගිහි මග හඳුන්වා ඇත්තේ ධනය ලබන මග ලෙසයි. ගිහි ජීවිතය හා ධනෝපායනය අතර මෙතරම් සමීප සබඳතාවක් දක්වා ඇත්තේ ගිහි ජීවිතය ආර්ථික චර්යාව හා බැඳී ඇති හෙයිනි.

වරක් ගෘහස්ථයන්ට ගැළපෙන ධර්මයන් ඉගෙනීම සඳහා තථාගතයන් වහන්සේ වෙත පැමිණි "දීඝජානු" නම් තැනැත්තා ගිහියන් හඳුන්වා ඇත්තේ, "තථාගතයන් වහන්ස, අපි ගිහිව පස්කම් සැප විඳිමු. අඹු දරුවන් මැද වෙසෙමු. කසී සඳුන්, මල් ගඳ විලවුන් පරිභෝග කරමු. රන්, රිදී, මසු, කහවණු භාවිත කරමු" යනුවෙනි. එම ජීවන රටාව ගිහි පිළිවෙත ලෙස මැනවින් දත් තථාගතයන් වහන්සේ ඔවුනට ගැළපෙන දහමක් දෙසූහ. මෙහි සඳහන් වන රන්, රිදී, මසු, කහවණු භාවිතය යන්නෙන් අදහස් වන්නේ ආර්ථික ක්‍රියාවලියයි. ධම්මික සූත්‍රයේදී තථාගතයන් වහන්සේ ගිහි ජීවිතය විග්‍රහ කොට ඇත්තේ,

"ධම්මේන මාතා පිතරෙ භාරෙය්‍ය
පයොජයෙ ධම්මිකං යො වණිජ්ජං
එතං ගිහි වත්තයං අප්පමත්තො
සයං පභෝ නාම උපෙති දෙවං" (406)

යනුවෙන්ය. එහි අර්ථය වන්නේ,

"ධර්මයෙන් ධනය උපයා මා පියන් පෝෂණය කරන්න. දැහැමි වෙළෙඳාමෙහි යෙදෙන්න. මෙසේ අප්‍රමාදීව ගිහි ගෙයි විසීමෙන් ස්වයං ප්‍රභ දෙවියන් අතර උපදී" යනුවෙනි.

ගිහියාගේ ආර්ථික චර්යාව සාර්ථක කරගැනීමට අදාළ උපදෙස් රාශියක් බුදු දහමෙන් සපයයි. ගිහියා විඳින සුව පිළිබඳ කරුණු දක්වමින් අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ හා අනවජ්ජ සුඛ වශයෙන් කරුණු සතරක් දක්වා තිබේ.

නූතන ආර්ථික චින්තනය හා බුදු දහමේ ආර්ථික චින්තනය අතර විශාල වෙනස්කමක් පවතී. තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත්තේ උට්ඨාන වීර්යයෙන් යුක්තව, දෑත දෙපය වෙහෙසා, දහදිය වගුරුවා, ශ්‍රමය යොදවා, ධාර්මික ලෙස ධනය උපයා ගත යුතු බවයි. වරක් මොනම හේතුවක් නිසාවත් අධර්මයෙන් සමෘද්ධිය නොපැතිය යුතු බව තථාගතයන් වහන්සේ දේශනා කොට තිබේ.

"න අත්ත හේතු - න පරස්ස හේතු
න පුත්ත මිච්ඡෙ - න ධනං නරට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා"

(තමා වෙනුවෙන් හෝ අනුන් වෙනුවෙන් හෝ වැරදි අයුරින් දරුවකු, ධනයක් හෝ රටක් නොපතන, අධර්මයෙන් තම සමෘද්ධිය නොපතන තැනැත්තා සිල්වතෙකි, නුවණැත්තෙකි, ධාර්මිකයෙකි.)

බෞද්ධ ආර්ථික දර්ශනයට අනුව මිනිසා මූලික ආර්ථික අවශ්‍යතා සමූහයක් වෙයි. එනම් ආහාරපාන, ඇඳුම් පැලඳුම්, වාසස්ථාන, යාන වාහන සහ බෙහෙත් හේත්ය. මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදලේ අවශ්‍යතාව මතුවන බැවින් අවශ්‍යතා සපුරා ගැනීමට මූලික වශයෙන් තමන්ට ගැළපෙන වෘත්තියක් හෝ ව්‍යාපාරයක් තෝරා ගැනීමට සිදුවේ. බුද්ධ කාලීනව පැවැති වෘත්තීන් අතර,

කෘෂි කර්මාන්තය (කසී), වාණිජ කටයුතු (වණිජ්ජ), පශු සංරක්ෂණය (ගෝරක්ඛ), රාජ්‍ය සේවය (රාජ පෝරිස), ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර), හමුදා සේවය (ඉසසත්ථ).

මෙම වෘත්තීන් අතරින් එකල වඩාත් ජනප්‍රිය වන්නේ ඇත්තේ කෘෂිකර්මය, පශු රක්ෂණය හා වෙළෙඳාමය. වෙළෙඳාම පහසුවෙන් පොහොසත් වීමට මෙන්ම පිරිහීමටද මගක් බැවින් ඇතැම් වෙළෙඳාම් හා උපක්‍රම අනර්ථකර බව තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත.

සත්ත්ව වෙළෙඳාම, අවි ආයුධ වෙළෙඳාම, විස වෙළෙඳාම, මස් වෙළෙඳාම, මත්ද්‍රව්‍ය වෙළෙඳාම.

මේවායින් වැළකී යහපත් වෙළෙඳාමක නිරත වුවද කිරුම් මිනුම් ආදියෙන් වංචා සිදු කිරීමට ඇති ඉඩකඩ විවේචනයට ලක් කෙරේ.

- තුලා කූට - තරාදිය උපයෝගී කොට වංචා සිදුකිරීම.
- කංස කූට - භාණ්ඩයේ නැති ගුණ පැවැසීම.
- මාන කූට - මැනීමේදී සිදුකරන වංචා.

මේ කවර රැකියාවක නිරත වුවද සාර්ථක ආර්ථිකද ජීවිතයක් සඳහා ගත හැකි උපදේශ රැසක් තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත.

උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තා, සමජීවිකතා.

මේ සියල්ල සලකා ඔබ නිතර දකින ප්‍රකට දානපතියාගේත්, සමාජ සේවකයාගේත්, එසේ නැතිනම් ගමේ මුදලාලිගේත් සැබෑ බෞද්ධකම ගැන සිතා බලන්න. එහෙමත් නැත්නම් ඔහුගේ ධාර්මිකකම ගැන සොයා බලන්න. ඇත්තටම ඔහු සැබෑ ධාර්මික බෞද්ධයෙක්ද? බුදුදහම නමැති තරාදියෙන් ඔබත් එය කිරා බලන්න.

**සුපුන් තිලක්ෂණ ගුණතිලක**
**ශ්‍රී නාථ දේවාල දහම් පාසල, මහනුවර.**

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

# ලංකාවේ දඹ රන් බුදු පිළිම තිබෙනවාද?



# දඹරන් බුදු පිළිම යනු මොනවාද?


ලංකාවේ ඇති දඹරන් බුදු පිළිම ශ්‍රද්ධාවතුන්ගේ භක්තිය වඩන ජනප්‍රවාද හා මිථ්‍යා විශ්වාස රැසක් මිශ්‍ර වූ මාතෘකාවක් බවට පත්ව ඇත. පළමුව ''දඹ රත්තරන්'' යනු කුමක්ද වටහා ගනිමු. ජනප්‍රවාද අනුව බුදු හිමි මල්ල රජ දරුවන්ගේ අඹ උයනේදී පිරිනිවන් පෑ පසු බුදු හිමිගේ ශ්‍රී දේහය රත්රන් දෙනක බහා සිරුර ගරු සත්කාර ඇතිව ආදාහනය කළ බව කියැවෙයි. බුදු හිමිගේම අධිෂ්ඨානය අනුව මෙම ආදාහනයේදී වන්දනාවට බුද්ධ ධාතු නොදැවී ඉතිරි විය. එමෙන්ම රත්තරනින් කළ දෙන උණු වී එම දෙන සතර කෙළවරින් බුදු පිළිම හතර පැන නැගුණු අතර ඒවා කලක් දඹදිව තිබී මලියදේව මහ රහත් හිමි විසින් මේ දඹරන් බුදු පිළිම හතර ලංකාවට වැඩමවා ඇත.

මේ ජනප්‍රවාදය අනුව දඹරන් බුදු පිළිම යනු බුදු හිමිගේ ශ්‍රී දේහය ආදාහන උළෙලේදී දැවී රත්‍රන් දෙන උණුවී නිර්මාණය වූ බුදු පිළිම හතරක් සේ අදහස් වෙයි. ඒ අනුව පිරිසිදු රත්තරනින් ඒවා ඉබේ පහළ වූ අතර කාලයක් ඒවා දඹදිව තිබුණි. මේ ජනප්‍රවාදය අනුව මේ බුදු පිළිම නිර්මාණය ක්‍රිස්තු පූර්ව 543 පමණ වැටෙයි. මලියදේව රහත් හිමි ලංකාවේ වැඩ විසූ අන්තිම රහත් හිමි නම බව ජනප්‍රවාදවල කියැවෙයි. එතුමා ජීවත් වූයේ දුටුගැමුණු රජු අවදියේ පමණය. (ක්‍රි.පූ. 161-137) මලියදේව හිමිගේ නම වංශකතා හා සාහිත්‍ය මූලාශ්‍රවල විවිධ අයුරින් එයි. වඩා ප්‍රකට නාමය ''මලියදේවයි''. එහෙත් නිවැරදි නාමය ''මලයදේව'' ලෙස ගතහොත් එහි අර්ථය එතැන කඳු රටේ හෙවත් මලය අඩවියේ උපන් අයෙකු බවයි. මලියදේව හිමි කලින් කල වැඩ සිටි ස්ථාන ගණනාවක් පිළිබඳ ජනකතා ලංකාවේ විසිර ඇත. එතුමා දඹදිව සිට මේ දඹරන් බුදු පිළිම හතර ලංකාවට වැඩම වූ බව කියැවෙයි.

''දඹරන්'' යනු ''පිරිසිදු රත්‍රන්'' යන අර්ථය දෙයි.මේ අනුව දඹරන් බුදු පිළිම වෙනත් ලෝහ වර්ග මිශ්‍ර නොකොට තනි රත්තරනින් තෙලූ ඒවාය. වෙනත් ලෝහ මිශ්‍ර නොකොට සාදන නිර්මාණවලට පැවැත්ම, ශක්තිය අඩුය. ඒ නිසා සුළු ප්‍රමාණයක් වෙනත් ලෝහ රත්‍රන්වලට එකතු කිරීම සම්ප්‍රදායයි. ''දඹරන්'' යනු වෙනත් ලෝහ මිශ්‍ර නැති පිරිසිදු රත්‍රන්ය. කෝට්ටේ කල විසූ ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතී බමුණා තම ගුරු දෙවියා වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමිට පූජා පිණිස ගුරු පඬුරු පිණිස දඹරන් ගෙනා බව කියැවෙයි. මලියදේව හිමි දඹදිවින් ගෙනා බව කියන දඹරන් බුදු පිළිම හතර ලංකාවේ විහාර හතරක තැනපත් කෙරිණ. කෑගල්ලේ පට්ටාරාම විහාරය, කොත්මලේ පුහුල්පිටිය විහාරය, හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාරය හා පදියපැලැල්ල නුදුරු මොරපාය රජමහා විහාරය මෙම පැරණි දඹරන් බුදු පිළිම හතර වැඩ සිටි හා වැඩ සිටින ස්ථානයි. ඉන් ස්ථාන දෙකක පමණ තිබූ දඹරන් බුද්ධ රූප සොරුන් විසින් පැහැරගෙන ගොස් ඇත. දඹරන් බුදු පිළිම හතරට අමතරව කටුගස්තොට නුදුරු කටරාන්ගල රජමහා විහාරයේ පැරණි දඹරන් බුදු පිළිමයක් දැකිය හැක. මෙය කිහිප වරක් සොරු පැහැර ගෙන හොරුන් විසින් කැබලිවලට කපා දමා තිබියදී යළි හමුවී සොයාගෙන ඇත.

ඉහත දැක්වූ විහාර හතර ආශ්‍රිතව මලියදේව හිමි කලක් ඒ ස්ථාන ආශ්‍රිතව ජීවත් වූ බව ජනප්‍රවාද තොරතුරුවල කියැවෙයි. කෑගල්ලේ වට්ටාරාමය කාලයක් මලියදේව හිමි ජීවත් වූ ස්ථානයකි. එම මලියදේව හිමි ගැන විවිධ

# තිබෙනවා නම් ඒවා නිර්මාණය වුණේ කුමන යුගයකදීද?



ජනකතා පැතිර ඇත. කොත්මලේ පුහුල්පිටිය වටාද මලියදේව හිමි ගැන ජනප්‍රවාද බැඳී ඇත. පාලි සහස්සවත්ථුප්‍රකරණය, පාලි රූපවාහිනී, සිංහල සද්ධර්මාලංකාරය අනුව මලියදේව හිමිට උවටැන් කළ "මේඝවර්ණ" නම් දෙවියකු ගැන මෙම ග්‍රන්ථවල එන මේඝවර්ණ කතා වස්තුවේ එයි. එම කතාවේ කියැවෙන මේඝවර්ණ දෙවි වැඩ වාසය කළේ පොළොන්නරුවේ දිඹුලාගල නැත්නම් පත්විල ආශ්‍රිත හුන්නස්ගිරිය කඳු මුදුනේය. මේ මේඝවර්ණ දෙවි මලියදේව හිමි සමග පුහුල්පිටියට ගිය අතර කොත්මලේ පුහුල්පිටියේ තිබූ දඹරන් බුදු පිළිමයේ ආරක්ෂිත දේවතාවා ලෙස පුහුල්පිටිය විහාරයේ වෙනම කුටියක පුද ලබයි. එහෙත් පුහුල්පිටිය දඹරන් බුදු රුව හොරු පැහැර ගත්හ.

ජනප්‍රවාද අනුව නම් මෙම දඹරන් බුදු පිළිම බුද්ධ පරිනිර්වාණය සමග ක්‍රිස්තු පූර්ව 543 ඉබේ නිර්මාණය වූ ඒවාය. ඒ කතාව අනුව ඒවා ඉබේ නිර්මාණය වී අවුරුදු 400 කට පමණ පසු දුටුගැමුණු රජු කල (ක්‍රි.පූ. 161-137) වැඩ විසූ මලියදේව හිමි ලංකාවට වැඩමවා ඇත. දඹරන් පිළිම වටා ඇති අද්භූත කතා සාමාන්‍ය බෞද්ධ ගැමියා තුළ ශ්‍රද්ධාව වැඩි කරවන කතා වස්තු වැනිය. මේ ජනප්‍රවාද තුළින් එම බුදු පිළිම පිළිබඳ සත්‍යය සොයාගත හැකිය. ඒ පිළිබඳව තොරතුරු කිහිපයක් ඉදිරිපත් කළ හැක.

මේ පිළිම බුද්ධ ශ්‍රී දේහය දැවෙන විට රන් දෙනෙත් ඉබේ මතුවූ බව කීම පිළිගත නොහැක. එසේ රන් දෙන් උණු වනවිට උණුවී ගිය රත්‍රන් වෙනම එකතු වූවා විය හැක.

ඉහත දැක්වූ ස්ථාන හතරේ බුදු පිළිමවල ඉරියව් මුද්‍රා වෙනස්ය. සමහරක් හිටි පිළිම අතර සමහර පිළිම සමාධි පිළිමයි.

නන්දසේන මුදියන්සේ ගම්පොළ යුගයේ නිර්මාණ අළලා ග්‍රන්ථ දෙක තුනක් පළ කර ඇත. මහාචාර්ය පරණවිතාන "ලංකා විශ්වවිද්‍යාල ඉතිහාසය" ග්‍රන්ථයේදී ගම්පොළ යුගයේ සංස්කෘතික නිර්මාණ අළලා පරිච්ඡේදයක් ඉහත ග්‍රන්ථයේ ලියා ඇත. ගම්පොළ සාහිත්‍ය දින පළවූ සාහිත්‍ය ගම්පොළ විශේෂ කලාපයේ තවත් තොරතුරු එම පිළිම පිළිබඳ එයි.

දඹරන් පිළිම වැඩ සිටින විහාර ගම්පොළ යුගයේ ඉදිවූ ඒවාය. නැත්නම් අතීතයේ සිට ප්‍රසිද්ධව සිට ගම්පොළ යුගයේදී පුනර්ජීවය ලැබූ විහාර විය. විශේෂයෙන් කොත්මලේ පුසැල්පිටිය විහාරය වඩාත් ප්‍රචලිතව පැතිර ගියේ හෙනකඳ බිසෝ බණ්ඩාර කුමරිය නිසා ගම්පොළ යුගයේදීය.

ගම්පොළ යුගයේදී ලංකාතිලකය, ගඩලාදෙණිය වැනි විහාර සෑදීමට දකුණු ඉන්දියාවේ විජයනගර් අධිරාජ්‍යයට අයත් ප්‍රදේශවල සිට දකුණු ඉන්දියානු ශිල්පී පවුල් මෙහි ඇදී ආ බව පෙනෙයි. ලංකාතිලක හා ගඩලාදෙණිය සෙල්ලිපි - සන්නස්වලින් මේ බව හොඳින් තහවුරු වෙයි. එසේ ලංකාවට පැමිණි "වියජනගර්" සම්ප්‍රදායට අයත් ශිල්පීන් එම ගඩලාදෙණිය, ලංකාතිලක වැනි විහාර නිර්මාණ නිමවූ පසු ආපසු ගියේ නැත. රජවරුන්ගෙන් සන්නස්, ගම්බිම්, තනතුරු ලැබී ලංකාවේම පදිංචි වූහ. අද ගම්පොළ අවට ඇති කාර්මික ශිල්පී පවුල් වැඩි පිරිස එදා එලෙස දකුණු ඉන්දියාවේ සිට ආ අයයි. ඔවුහු ලංකාවේ පදිංචිව ලාංකීය පවුල් සමග විවාහ ගනුදෙනුවලින් මිශ්‍රව විවිධ කලා නිර්මාණවල නිරත වූහ. ගම්පොළ, කිරිවවුල, ශිල්පී ගම්මානය ගම්පොළ කල ආ දකුණු ඉන්දීය ශිල්පීන්ගෙන් ඇතිවුණු එකකි. මෙවැනි ශිල්පී ගම් ගණනාවක් ගම්පොළ අවට ඇත.

මෙම දඹරන් බුදු පිළිමවල නිර්මාණ ශෛලිය අනුව ඒවා ගම්පොළ යුගයට වැටෙන බව නන්දසේන මුදියන්සේ කියයි. මහාචාර්ය පරණවිතාන දඹරන් බුදු පිළිම ගම්පොළ කලට වැටෙන බව කියයි. ඔවුන් මේ බුදු පිළිම දකුණු ඉන්දියාවේ ගුරු කුලයකදී නිර්මාණය කොට ලංකාවට ගෙනාවා විය හැක. නැත්නම් ලංකාවට ආ දකුණු ඉන්දීය ශිල්පීන් ගම්පොළ කල ලංකාවේදී නිර්මාණය කළා විය යුතුය. පසුකල ඒවායේ වැදගත්කම වඩාත් වැඩි දියුණු කිරීමට ඒ නිර්මාණ වටා බුද්ධ පරිනිර්වාණය, දෙන උණුවී දඹරන් පිළිම මතුවීම, මලියදේව හිමි වැඩමවීම වැනි ජනකතා මේ පිළිම වටා නිර්මාණය විය. දඹරන් පිළිමවල නිර්මාණ ශෛලිය ගම්පොළ යුගයේ "විජයනගර්" සම්ප්‍රදායේ ආභාෂය නිවැරදිව මූර්තිමත් කරයි.

**එස්. කේ. ජයවර්ධන**

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."



# පිරිත් පැන්වල නියම බලය ලැබෙන්නේ ගෞරවාන්විත ලෙස පිරිත් පැන් බෝතල තැබුවොතින් පමණයි

පිරිත් පැන් භාජනය යනුවෙන් හැඳින්වෙන්නේ බෞද්ධ ආගමික චතාවතක් වන පිරිත් දේශනයකදී භාවිත කරන ජලය සහිත භාජනයටයි. මෙම පදය පිරිත් පැන් ලෙස භාවිත කරනුයේද පිරිත් මගින් ලබාගන්නා සුවිශේෂ වටිනාකමක් සහිත ස්වභාවයක් මෙහි ඇති බැවිනි.


පිරිත් යනු සතර බණවර හෙවත් පිරුවානා පොත් වහන්සේ ලෙස හඳුන්වන ග්‍රන්ථයෙහි සියලුම සූත්‍ර ධර්මයන්ය. සතර බණවරවලට අන්තර්ගත නොවන හෙවත් අතිරේක වශයෙන් පිරිත් පොතේ අන්තර්ගත පිරිත් බොහෝමයක්ද ඇත. ඒ සියල්ල පිරිත් වශයෙන් සලකා සජ්ඣායනා කිරීම ශ්‍රී ලාංකික බෞද්ධ සම්ප්‍රදායකි. එසේ සජ්ඣායනා කරනු ලබන පිරිත් ලොව ඇති පවිත්‍ර සත් ක්‍රියාවක් ලෙස සලකති. පිරිත් කීම විවිධාකාරයෙන් සිදුකරයි. වරු පිරිත, වත් පිරිත, දෙවරු පිරිත, තිස් පැ පිරිත, තුන් තිස් පැ ප්හේ පිරිත, සති පිරිස ලෙස ඒවා නම් කළ හැකිය.

මෙම පිරිත් පින්කම්වල දැකිය හැකි අත්‍යවශ්‍යම අංගයක් ලෙස පිරිත් පැන් හඳුනාගත හැකිය. පැන් යනු ජලයයි. එහෙත් බෞද්ධයන් පිරිත් යන සත් ක්‍රියාව සමග ජලය, වතුර යන වචනය භාවිත නොකරයි.

ඒ සඳහා බෞද්ධ සම්ප්‍රදාය තුළ භාවිත වන පැන් යන ගෞරවනීය වචනය භාවිත කරයි. පිරිත් දේශනයක් පවත්වන ස්ථානයේ නැවුම් ජල බඳුනක් තබා එයට නූලක් සම්බන්ධ කොට ඉදිරියේ තබාගෙන (වඩා ඈතින් නොව) වාක් ශබ්ද තරංග වදින ලෙස පිරිත් කීම ඉපැරණි සම්ප්‍රදාය විය. සමහර විට පැන් බඳුන අතට ගෙන කලත්තමින් පිරිත් දෙසීම සිදුවූ බවද අප අසා ඇත්තෙමු. කෙසේ හෝ වේවා මේ උතුම් කාර්යය සඳහා භාවිත කරන ජල බඳුන පිරිත් පැන් කළය පමණක් නොව පිරිත් පැන් බෝතලය ලෙසද ව්‍යවහාර වේ. ඇතැම්හු වෙළෙඳ පොළේ ඇති පානීය ජල බෝතල් හා වෙනත් බෝතල්වලට ජලය පුරවා පිරිත් මණ්ඩපවල තබා ඊට නූල් සම්බන්ධ කරති. සාම්ප්‍රදායික බෞද්ධයන් පිරිත් පැන් කළයට තිබූ සම්භාවනීය ගෞරවය හා තත්ත්වය අද පිරිත් පැන් බෝතලයට නොලැබෙන බවද පෙනෙන්නට තිබෙන ලක්ෂණයකි. සාම්ප්‍රදායික බෞද්ධයෝ පිරිත් පැන් භාජනයට බහාලන ජලය සපයා දීම සම්බන්ධව ගෞරවනීය පිළිවෙතක් ක්‍රියාත්මක කළහ.

මෙලෙස ගරුසරුව සපයා ගත් ජල බඳුන සුදු පිරුවටයකින් සකසා ගෙන වියන් අල්ලා ඇතැම් විට ශබ්ද පූජා සහිතවද මණ්ඩපය කරා වැඩම කරවාගෙන

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



එයි. ඉන්පසු ගොක් කොළ ආවරණයකින් සරසා මණ්ඩපයේ අසුන මත තබා ප්‍රධාන පිරිත් හුයට සම්බන්ධ කරනු ලබයි. සාම්ප්‍රදායික සමාජ රටාව තුළ දක්නට ලැබුණු මෙම ලක්ෂණ දැන් වියැකෙමින් පවතී. වර්තමානයේ පැන් ගනු ලබන්නේ නළ ජලයෙන් නිසා පෙර පැවැති ගෞරවනීය භාවය ලබාගැනීමට නොහැකිය. පිරිසිදු බව පතා පෙරහන් කඩකින් පෙරා ජලය ලබාගැනීම සිදුකරති. මෙය නූතන සමාජයට ගැළපෙන ලෙස බෞද්ධ ආගමික සංකල්පවල වෙනස්වීම පිළිබිඹු කරයි.

මිනිස් ජීවිතයක උපතේ සිට මරණය තෙක් සුවිශේෂී අවස්ථාවල පිරිත් පැන් භාවිත කරති. දරුවකු බිහිවීමට පළමු ප්‍රසූතිය බලාපොරොත්තු වන මවගේ ආරක්ෂාව සඳහා අංගුලිමාල පිරිත දේශනා කොට පිරිත් පැන් බීමට දෙයි. ඉතාම ආසන්න කාලයේදී අංගුලිමාල පිරිත තැඹිලි ගෙඩියකට ජීවං කර බීමට දෙයි. සාම්ප්‍රදායික සමාජයේ දරු ප්‍රසූතිය යනු ජීවිතය හා මරණය අතර සටනකි. මේ නිසා ගැබිනියට චිත්ත ශක්තිය ලබාදීමත්, පිරිතේ බලයෙන් මෙයින් බලාපොරොත්තු වූ බව සිතිය හැකිය. වර්තමාන කාලයේදීද මව් පදවිය බලාපොරොත්තු වන්නෝ අංගුලිමාල පිරිතෙන් ආරක්ෂාව බලාපොරොත්තු වෙති.


ළදරු කාලයේදී පිරිත් පැන් භාවිත කරන අවස්ථාවක් ලෙස කොණ්ඩය කැපීම, කන් විදීම ආදී අවස්ථා සැලකෙයි. කොණ්ඩය කැපීමේදී හක් ගෙඩියකින් හිසට පිරිත් පැන් වත් කිරීම සිදුකරනු ලබයි. කන් විදීමේදීද කනට දමන ආභරණවලට පිරිත් පැන් ඉසීම සිදුකරනු ලබයි.

රෝගාතුර වීම, විවාහය, මරණය යන සෑම අවස්ථාවකදීම සෙත් පිරිත් දේශනා කරනු ලැබේ. මෙහිදී පිරිත් පැන් ස්වල්පයක් පානය කිරීම සහ හිසෙහි ගා ගැනීම මගින් ආශීර්වාදය සැලසෙන බව විශ්වාසයයි. මරණයට පත්ව ආදාහනය කළ ස්ථානයට පිරිත් පැන් ඉසීම සිදුකරනු ලබයි. මෙමගින් මිනී අළු සූනියම් වැනි විනාශකාරී දේවල්වලට යොදා ගැනීම වළක්වා ගැනීම සිදුකරනු ලබයි. පිරිත් පැන් ඉසීමෙන් පසු එම අළුවලින් අනර්ථකාරී ක්‍රියා කිරීමේ ශක්තිය නැතිවන බව මිනිසුන්ගේ විශ්වාසයයි.



මේ වස්තූන්ට මෙබඳු බලයක් ආරෝපණය කිරීමට හේතුව ලෙස සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ ලෞකික අපේක්ෂාවන්ට කඩිනම් පිළිතුරු බුදු සමය තුළ නොමැති වීමයි. ලෞකික හා පෞද්ගලික අපේක්ෂා ඉටුකර ගත හැකි ක්‍රමෝපායයන් ථෙරවාදී බුදු සමය තුළ ඇතත් ඒවා සාමාන්‍ය ජනයා අපේක්ෂා කරන තරම් කඩිනම් ප්‍රතිඵල අත්කර දෙනු නොලැබේ. මෙබඳු ක්‍රමවලට වඩා සාමාන්‍ය ජනයා පහසු ක්‍රම සොයති. මේ අනුව බුදු සමයේ ඇති බලය, ශක්තිය, ආශිර්වාද භෞතික වස්තූන්ට (පිරිත් පැන්, පිරිත් නූල්) ලබාගැනීමට පෙළඹී ඇත.

පිරිත් සජ්ඣායනයේදී එම ස්ථානයට යාබදව තනා තිබෙන වතුර (පැන්) කළයටත් එම ශබ්ද තරංග අවශෝෂණය වීමක් සිදුවේ. මැටි



කළයක් තුළට ඇතුළු වන ශබ්ද තරංග ආපසු පිට නොවේ. ඊට හේතුව මැටිවල තරංග පහළ අගයක් ගැනීමයි. මේ නිසා මැටි කළයට ඇතුළු වන ශබ්ද තරංග සංඛ්‍යාතය වැඩිවීමත් සමග එහි ජලය උතුරා යයි. මේ අනුව ශබ්ද තරංග මගින් පිරිත් පැන් බලයක් ලබාගෙන යහපත, සතුට, සැපත උදාකරන බව විද්‍යාත්මකව සනාථ වෙයි.

වර්තමානයේ පිරිත් පැන් භාවිත කරනුයේ ශුද්ධ වස්තුවක් ලෙසිනි. කිසිදු ආධ්‍යාත්මික පාරිශුද්ධත්වයක් නොමැති පිරිස් පවා පිරිත් පැන්වල අනුහසින් තම බලාපොරොත්තු, අපේක්ෂා ඉටුකර ගැනීමට උත්සාහ කරති. වර්තමානයේදී එය කොතරම් ජනප්‍රියත්වයට හා ව්‍යාප්තියට පත්වූයේද යත් ලෙඩ දුක් දුරුවෙතැයි කියමින් කිසිදු ප්‍රමිතියකින් තොරව පිරිත් පැන් බෙදාහැරීමෙන් සංවිධාන ගතවූ බොදු ව්‍යාපාරද ඇත. මෙබඳු ක්‍රියා නිසා ඒ පිළිබඳ විවේචනද සමාජය වෙතින් එල්ල වේ.

විද්‍යාත්මක සොයා ගැනීම බෞද්ධ පිරිත් පැන්වලට කිසියම් බලයක් ඇති බව ප්‍රකාශ කරන අතරම අනෙකුත් ආගම්වල ශුද්ධ වස්තූන්ටද බලයක් ඇති බව පිළිගනී. මෙම විද්‍යාත්මක විග්‍රහය බුදු දහමට අනුව කොතරම් යෝග්‍යදැයි ප්‍රශ්න කළ හැකිය. මෙබඳු මතිමතාන්තර පැවැතුණත් ජීවම් වූ පිරිත් පැන්වල කිසියම් ආශිර්වාදාත්මක බලයක්, ශක්තියක් ඇති බව සාම්ප්‍රදායික බෞද්ධයෝ පිළිගනිති. මේ නිසාම බෞද්ධ සමාජය තුළ පිරිත් සජ්ඣායනයත්, පිරිත් පැනුත් චිරාත් කාලයක සිට නොනැසී පවතී.

**පූජ්‍ය යටලත්තේ කුසලානන්ද හිමි**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## සම්මා සම්බුදු කරුණා සෙවණට පියවර තබමු

සම්මා සම්බුද්ධ ශාසනයේ උපරිම ඵලය නෙළා ගත් පුද්ගලයා වන්නේ චතුරාර්ය සත්‍ය අවබෝධ කළ උත්තමයාම බව අවිවාදිතය. එම උතුම් සත්‍යය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීමෙන් එම ඵලය අපට සාක්ෂාත් කරගත හැකි බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. මේ ප්‍රඥාසම්පන්න ගමන යාමට අප තුළ අවබෝධය, වීර්යය සහ ඉවසීම තිබිය යුතුමය. වීර්ය තිබෙන කෙනාට ඉවසීම නොමැති නම් මෙහි ගමනාන්තයට ළඟාවිය නොහැකිය. ඊට හේතුව එම ගමන් මාර්ගයෙහි 'මමත්වය' රැඳී තිබීමය. සියලු යහපත් අපේක්ෂාවන් ඉෂ්ට සිද්ධ කරගන්නට මමත්වය හා ඇලීම සිතින් ඉවත් කරගත යුතුමය. එමනිසා මේ උතුම් නිර්වාණාවබෝධය පිණිස සිහිනුවණින් යුතුව ක්‍රියාකිරීම අනිවාර්ය බව ඔබ වටහා ගත යුතුවේ. මෙහිදී ඔබට ශ්‍රී සද්ධර්මය කල්‍යාණ මිත්‍රයා කොට ගත හැකිය.


ඔබ අද ගතකරන ජීවිතය තුළදීම චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමට අපහසුවක් නැත. ඒ සඳහා ඔබට අවශ්‍ය වන්නේ ශ්‍රද්ධාව, වීර්යය හා හිරිඔතප් යන කරුණු තුන බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. අප තථාගතයන් වහන්සේ මේ උතුම් ශ්‍රද්ධර්මය දේශනා කළේ ඔබ අප සැමදෙනාගේම නිර්වාණාවබෝධය සඳහාය. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල්ම පියවර වන්නේ සම්මාදිට්ඨිය හෙවත් යහපත් දැකීමය. මුලින්ම තෙරුවන් කෙරෙහි උපදින ශ්‍රද්ධාවට මුල් තැන දිය යුතුවේ. එය වැඩෙන්නේ ප්‍රඥාව පාදක කොටගෙනය. ප්‍රඥාව සඳහා අවශ්‍ය වන්නේ වීර්ය, සති හා සමාධි යන ගුණාංගයන්ය. එවිට අප හදවත් බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයෙන් ඔද වැඩී යයි. උන්වහන්සේ සසර පුරාවට පාරමී ධර්මයන් පුරමින් සාක්ෂාත් කළ ඒ මහා කරුණා ගුණයේ සෙවණට යාමට ඔබ අප හැම වීරිය වැඩිය යුතුය. ■

සිල් සමාදන්වීම දුරාතීතයේ සිට අපේ රටේ බෞද්ධයන්ට ඉතා හුරුපුරුදු දෙයක්. සීහලවත්ථු වගේ ඉතා පැරණි ධර්ම ග්‍රන්ථ කියවන කොට ඒ බව ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. පොහොයට පන්සල් ගොස් අටසිල්, දසසිල් සමාදන් වීම හුදෙක් වයස්ගත උදවිය පමණක් අනුගමනය කළ යුතු දෙයක් හැටියටයි මීට දශක කිහිපයකට කලින් සමහරුන් දුටුවේ. නමුත් ඒ කාලයේ බටහිර මිෂනාරී අධ්‍යාපනය විසින් යටපත් කොට දැමූ බෞද්ධ චින්තන රටාව පුනර්ජීවනයක් ලැබුවා. ඒ දුරාතීතයේ සිට බුදුදහම අපේ දේශීයත්වය හා තදින් බද්ධව පැවැතීම නිසයි. ඒ වගේම භෞතික වශයෙන් දියුණු බටහිර ජාතීන් පවා බෞද්ධ අධ්‍යාත්මයේ ගුණ දන්නවා. ඒ වෙත නැඹුරු වීම පස්කම් සැපයෙහි ආදීන පිළිබඳ විවිධ අයුරින් වටහා ගැනීමට හැකි බුද්ධිමත් තරුණ පරම්පරාවක් බිහිවීම ආදී කරුණු කීපයක් පැරණි සාම්ප්‍රදායික ආකල්ප යටතේ ශීල සමාදානය පිළිබඳ නව සමාජීය උනන්දුවක
තත්ත්වය
පාන්තික ත
තුළ සිල් ග
නොදෙවෙ
පුළුවන්. වි
පසුවන
මෙන්ම නව
වෘත්තිකයන්
ශීල සමාදා
දෙයක් බවට

□ ශීලය

මූලික ව
බෞද්ධ ජීවි
බෞද්ධයන්
පන්සිල් හඳු
නිති පන්සිල්

# සිල් සමාදන් පන්සලක් ඕ



''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු

ධයක් ඇතිවී තිබෙනවා. මේ
විශේෂයෙන් නාගරික මධ්‍යම
ා මැදිවියේ බොහෝ දෙනකු
ම්බන්ධයෙන් වැඩිහිටියන්ට
ද්දුවක් පළවී තිබෙනු දක්නට
ත් තරුණ සහ මැදිවියේ
ජිනේරු, ගණකාධිකාරී
ශු නියෝජනය කරන විද්වත්
සංඛ්‍යාවක් පුන් පෝ දිනයේ
යැදීම මේ වන විට සාමාන්‍ය
තිබෙනවා.

න්නේ මොකක්ද?

ත් බලන කොට ශීලය කියන්නේ
මූලික පදනම කියන්නත් පුළුවන්.
යන් පිළිපැදිය යුතු ශීලය වශයෙන්
මෙන්ම ඒ බව පැහැදිලි වෙනවා.
අතරේ පොහොය දිනවලදී ඊට



වඩා උසස් ශීලයක පිහිටීමේ වැදගත්කම බුදු දහමින් අවධාරණය කෙරෙනවා. "නිති පන්සිල් පොහොය අටසිල්" යන අපේ ගැමි සමාජ සම්මතයෙන්ම එය මනාව තහවුරු වෙනවා.

# වීමට

# මද?

**❒ සිල් සමාදන් වීමට පන්සලක්ම ඕනෑද?**

බොහෝ දෙනකු නම් කියන්නේ ශීලය යනු තමන්ගේ සිත, කය, වචනය හික්මවා ගැනීම නිසා ඒ සඳහා ස්ථානීය වැදගත්කමක් බල නොපාන බවයි. නමුත් ගෙදරදී පන්සිල් රකින බෞද්ධයා ඊට වඩා උසස් ශීලයක් රැකීමේදී ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් තෝරා ගැනීම වඩාත් යෝග්‍ය වෙනවා. ඒ අනුව දවසකට හෝ වරුවකට ගිහිගෙයින් නික්මී, ඒ කියන්නේ පංචකාම සම්පත්වලින් දුරස් වී ඒ උතුම් ශීල සම්පත්තියට හිමිකම් කීමයි වඩාත් යෝග්‍ය හා ශ්‍රේෂ්ඨ වන්නේ. ගිහි සැපෙන් හික්මීම හෙවත් නෙක්ඛම්මයක් බුදු දහමේ ඉතා ඉහළ ඇගැයුමට ලක්වන්නක්. ඒ සඳහා සුදුසුම ස්ථානය බෞද්ධ සිද්ධස්ථානයක් බව අමුතුවෙන් කිව යුතු නැහැ.


**❒ සිල් සමාදන් වීමට සිල් රෙදි අවශ්‍යමද?**

සිල් සමාදන් වීම හෝ සීලය ආරක්ෂා කිරීම කෙරෙහි හෝ ඇඳුමින් සෘජු බලපෑමක් සිදු නොවන බවයි සමහරුන්ගේ මතය. නමුත් සිල් සමාදන් වීමේදී බෞද්ධයන් දක්ෂිණාංශ කොට පළඳින සිල් රෙද්දේ සුවිසල් ආගමික සහ සංස්කෘතික වටිනාකමක් තිබෙනවා. මේ සිල් රෙද්ද උතුරු සළුව යනුවෙන්ද හඳුන්වනවා. මෙහි උතුරු යන්නෙන් අදහස් කරන්නේ උත්තරීතර නැතහොත් උතුම් යන්නයි. සිල් සමාදන් වීමේදී දක්ෂිණාංශික කොට පළඳින උතුරු සළුව ආර්යත්වයේ නැතිනම් උතුම් බවේ සංකේතයක්. අදත් උතුරු ඉන්දියානු ආර්ය ජනතාව තමන්ගේ සාම්ප්‍රදායික ඇඳුමක් වශයන් ඇඳුමට උඩින් මේ උතුරු සළුව පැළඳ සිටින අන්දම ඔබත් දූක ඇති. ඔවුන් එසේ උතුරු සළුවෙන් තමන්ගේ ගෝත්‍රයේ ආර්යත්වය විදහා දක්වන අතර සිල් සමාදන් වන විට පළඳින උතුරු සළුවෙන් විදහා දූක්වෙන්නේ බෞද්ධ නිර්වාණගාමී ප්‍රතිපදාවේ ඇති ආර්යත්වය හෙවත් උතුම් බවයි. ඒ වගේම සිල් සමාදන් වීමේදී අඳින ඇඳුම සුදු පැහැයෙන් සහ චාම් බවින් යුක්ත වීමත් ඉතා වැදගත්.

**❒ සිල් සමාදන් වීමට පිරිසක් එක්විය යුතුමද?**

ශීලය කියන්නේ පුද්ගල බද්ධ වූවක්. ඒ නිසා සිල් සමාදන් වීමට තවත් පිරිසක් කුමකටදූයි සිතීමත් එක්තරා අන්දමකින් සාධාරණයි. නමුත් බොහෝ විහාරස්ථානවල සිල් සමාදන් වීමෙන් පසු ඉටු කළ යුතු වත් පිළිවෙත් සහිත පෝදා වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව පිරිසක් වශයෙන් සිල් සමාදන් වූ පසු ඒවාට අනුගත වීමේ පහසු හැකියාවක් තිබෙනවා. නමුත් මේ වැඩසටහන් සමාජ, සංස්කෘතික හා අධ්‍යාපන වයස් ආදී විවිධ මට්ටම් නියෝජනය කෙරෙන නිසා තමන් සිල් සමාදන් වන ස්ථානයේ පැවැත්වෙන පෝදා ශීල වැඩසටහන පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීමත් ඉතා වැදගත්.

**පූජ්‍ය අහුන්ගල්ලේ දීපවංශ හිමි**





ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)

# ඔබත් කිරි අම්මාවරුන්ට දානයක් දෙන්නට සිතා සිටිනවාද?



## මේ විදියට සිදුකළොත්


**ඔබට පත්තිනි දේව මෑණියන්ගේ පිහිට ලැබෙනවා නොඅනුමානයි**

බාල, මහලු, ළදරු, කවරකු හෝ වෙනුවෙන් පැවැත්වෙන යම් රෝග නිවාරණයක් සඳහා වූ භාරයක් පත්තිනි මෑණියන් නමින් නම් එම භාරය ඔප්පු කිරීම සඳහා කිරි අම්මාවරුන්ගේ දානය සිදු කළ යුතුය.

විවිධ තරාතිරම්වල අවශ්‍යතාවන් සඳහාද කිරි අම්මාවරුන්ගේ දානය පැවැත්වේ. ගව පට්ටි පාලනය කරන්නන්, නිවසේ ආර්ථික සංවර්ධනය බලාපොරොත්තු වන්නන්, ව්‍යාපාරික දියුණුව පතන්නන්, කුඹුරු ආදියෙහි එලදාව ඉල්ලා සිටින්නන්, තමන්ගේ සද් කාර්යය ඉටුවූ වහාම කිරි අම්මාවරුන්ගේ දානය දී සිතට සහනය ලබාගනිති.

දෙවියන්ගේ ලෙඩ, පාවන රෝග, ඇස්වහ කටවහ හෝ වහ, අඬෝවැඩියා ආදිය සතු වස් දොස් ඉවත් කර විහත විද්වංසනය කිරීමටද කිරි අම්මාවරුන්ගේ දානය සමත් වේ.

මෙතරම් උත්කෘෂ්ට වූ මෙම දානය පිරිනැමීම සිදුකළ යුත්තේ දේව ශාන්ති



කර්මයක් ලෙසින් ඉහළ සංස්කෘතික මංගල්‍යය ස්වරූපයෙනි.

සත් පත්තිනි, දොළොස් පත්තිනි යන ආත්මභාව විවරණයක් සහිත පත්තිනි මෑණියන් පිළිබඳව ලක්දිව ජනතාව අතර පවතින භක්තිය පති භක්තියේ ගෞරවයත් සමග සංකලනය වී හට ගැනුණකි. එම ගෞරවය ගෞරවාදරයට පාත්‍ර කොට විශ්වසනීයත්වය තුළින් ඇඟිලි බැඳීම සිදු වන්නේ කිරි අම්මා දානයෙනි. කිරි දානය, අම්මා දානය, කිරි අම්මා දානය, කිරි අම්මාවරුන්ගේ දානය, කන්නකී දානය, පත්තිනි දානය, සිද්ධ පත්තිනි දානය, කිරි දේව දානය නමින්ද කිරි අම්මාවරුන්ගේ දානය හැඳින්වේ.

- **අතිඋත්තම දේව කාන්තාවක වූ පත්තිනි මෑණියන් හඳුන්වන වෙනත් නම්ද හඳුනා ගන්න.**

කන්නකීය, මනිමේ කන්නකී, කනක මැණික, කනක බිසෝ, කන්නගි, පද්මිණී, එතන හාමි, මා පත්තිනි, පත්තිනි දේවිය, අම්මා දේවිය, කිරි අම්මා, හළඹ කුමාරි කිරි අම්මා, හඳුන් කුමාරි කිරි අම්මා, තපස් පුත්‍රී, වීර පත්තිනි, මහා පත්තිනි, සිද්ධ පත්තිනී, අඹ දේවිය, දේවස්ත්‍රී, සිරිමා පත්තිනි, ජානකී යන නම්වලින්ද පත්තිනි මාතාවෝ හඳුන්වති.

- **පත්තිනි මෑණියන්ගේ රූපකාය.**

රුවින් අගතැන්පත් රන්වන් සමක් ඇති සුරූපී දෙවඟනකි.

ඉතා දිග - වරලසක් ඇත්තීය.

දකුණු අතෙහි - පුන් කළසක් ඇත.

වම් අතෙහි - හඬ දෙන සළඹකි.

හිසෙහි - නාග මාණික්‍යයක් දරන්නීය.

ඇඟ ඇඳි සළුව පුරා - මිණි මුතු දිළිසෙයි.

කන් දෙක දීප්තිමත්ව - (අඹ වැනි) නිල් මැණික් දෙකක්.

දෙවුර වැසුණු සළුව - ඝන රනින් සාදා ඇත.

ගෙලට - මුතු මාලා පැළඳ ඇත.

දෙතන - දඹ දූහුලින් වසා රනින් සරසවා ඇත.

කර වට - මල් දමාගෙන ඇත.

උරට - සුදු වස්ත්‍රයක් පැළඳී.

දෑතෙම - වළලු හා පාද සිලම්බු.

දේවතත් වශයෙන්ද, දේවාභාරණ වශයෙන්ද දේවරත්වාප වශයෙන්ද හඳුන්වන්නේ පත්තිනි මෑණියන්ගේ ආයුධ වන්නේය.


එම ආයුධ නම්:

කඩුව, දුන්න, පළිහ, මුගුර සෝලුව, රන් අඹ වල්ල.

ආභරණ යැයි කියන්නේ සලඹ හෙවත් නූපුරය වන්නේය.

- **සළඹෙන් කියැවෙන කරුණු තුනකි.**

1. රාජ ධර්මය වරදවා ගත් රජුගේ මාරයා.



2. පතිවෘතාවෙහි අගපත් තැනැත්තිය.
3. කර්ම විපාකයේ එල දීම වැළැක්විය නොහැක.

- **කිරි අම්මාවරු හත්දෙනා වන්නේ:**

1. පොළොව මහී කාන්තාව.
2. මුහුදේ මහී කාන්තාව.
3. සරස්වී දේවීන් වහන්සේ.
4. සීතා පරමේශ්වරී.
5. මහීකත හෙවත් අම්මා දේවිය.
6. වල්ලි මාතාවෝ.
7. පත්තිනි දේවීන් වහන්සේ.

- **දානය සඳහා මෙබඳු කාන්තාවන් කැඳවන්න එපා.**

1. ඉතා මහලු කාන්තාවන්.
2. සුව කළ නොහැකි රෝගී කාන්තාවන්.
3. අංග විකල කාන්තාවන්.
4. අන්ධ හෝ බිහිරි කාන්තාවන්.
5. අංශභාග හෝ අපස්මාර රෝගීන්.
6. ලැබූ දරුවන් මියගිය මව්වරුන්.
7. වැන්දඹු කාන්තාවන් (සැමියා මියගිය)
8. වඳ ස්ත්‍රීන්.
9. මත්ද්‍රව්‍ය හෝ මත්පැන් පානය කරන්නියන්.
10. මස් හෝ මාළු විකුණන කාන්තාවන්.
11. අනුන්ගේ ඇද හොයමින් කේලාම් කියන්නියන්.
12. සොර සැමියන් පතන්නියන් හෝ වෛශ්‍යාවන්.

- **කිරි අම්මාවරුන්ගේ දානය දෙන දිනය.**

හඳ පිරීගෙන එන පූර පක්ෂයේ දිනයක් මේ සඳහා යොදා ගත යුතු වේ. එමෙන්ම සඳුදා, බදාදා, සෙනසුරාදා වැනි කෙම්මුර දිනයන් නම් වඩා සුදුසුය.

- **දානය දීමට පෙර**

1. බුලත් කොළ හතක් ගත් ගෙහිමියා කිරි අම්මාවරු සොයා ගොස් බුලත් කොළය බැගින් දී ආරාධනා කරයි.
2. නිවසේ පිරිස කිළි කුණුවලින් වෙන්වී සිටිය යුතුය.
3. නිවස පිරිසිදු කොට තැබිය යුතුය.
4. සුදු හඳුන් කුඩු, කහ කුඩු, පොල් කිරි දියර එකට කලවම් කර නිවස පුරා පැන් ඉසීම කළ යුතුය.
5. සුවඳ දුම් ඇල්ලිය යුතුය.
6. කිරි අම්මලාගේ පා සේදීමට වතුර බේසමක් තබන්න.

- **සැකසෙන ක්‍රමය:**

1. නිවස ඉදිරිපිට මල් පැලක් තනන්න.

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"

2. නිවසට ඇතුළු වූ පසුව පෙනෙන පරිදි පත්තිනි මල් යහන හදන්න.

- 1. මල් පැල තැනීම:

ගොක් අත්තකින් සාදන මල් පැලක් කෝටු මත රඳවා ඒ මත බුලත්, පහන් තබා හඳුන්කූරු දල්වන්න. එහි පැන් බඳුනක් පමණක් තබන්න.

- 2. නිවස තුළ මල් යහන:

ඉදිරියට තුනක් හා පසුපසට හතරක් වන ලෙස කෝටු තබා එය මල් යහනක් සේ පිළියෙළ කරන්න.

මේසයකට ගැට ගසන ලද ලී කෝටුවලින්ද මෙම යහන සාදාගත හැකිය.

1. පිරිසිදු කළ කෙසෙල් කොළයක් ආසන ගෘහයේ එලන්න.
2. ඒ මත බුලත් කොළ දෙකක් තබන්න. (බුලත් කොළ ස්ත්‍රී බුලත් විය යුතුය.)
3. ලද පස් මල් ඉසින්න.
4. මල් අතුරුවන්න.
5. පිණිදිය ඉසින්න.
6. කපුරු දල්වන්න.
7. හඳුන්කූරු දල්වන්න.
8. පෙර අරන් තැබූ භාරය එහි තැන්පත් කරන්න.
9. සුවඳ දුම් අල්ලන්න.
10. කිරි උතුරුවන්නට මල් යහන ඉදිරිපිට ලිප සාදා තබන්න.

- කිරියා

රතු කැකුළු සහල් පිටි, පොල් කිරි, එනසාල්, කරදමුංග එකට එක්කොට ලිප තැබූ දියරය පදම් වනතුරු දකුණතට හැඳි ගෑමෙන් කිරියා සෑදෙයි.

- කැවුම්

කැවුම් සෑදීමේදී අච්චු කැවුම් වෙනුවට අතින් වක්කර ගත් කොණ්ඩ කැවුම් සැකසීම සිදුකළ යුතුය.

- කිරිබත්

කිරිබත් සෑදීමේදී මිටි කිරිම භාවිත කළ යුතුය. මිටි කිරි සෑදීමේ වතුර වැඩියෙන් දමා පොඩි කිරීමෙන් වැඩි දියරයක් සහිත පොල් කිරි එකවරින්ම ලබා ගන්න.

- කෙසෙල් ගෙඩි

කෙසෙල් ගෙඩිවල අග කළු නැටි කොටස් කපා ඉවත් කරන්න.

- වතුර

පෙරූ වතුර භාවිතයට ගන්න.

- මල්

ලොකු මල් වට්ටියක් සූදානම් කරගන්න.

- බුදුන් වැඳීම

නිවසේ බුදුන් වඩින තැන සකසා තබන්න. බුදු පහන පමණක් දල්වා තබන්න.

- දානය දෙන වේලාව

උදේ කපුටන් හඬන්නට පෙර දානය දිය යුතු වේ.


**ශාක්‍ය ඉඳුවර ගුණසේකර**



"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"



# බෞද්ධ විහාරස්ථානයක ඇති මේ අංග ගැන ඔබ දැනුවත්ද?



**■ දාගැබ හෙවත් චෛත්‍යය**

බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් කොට ඇති අපට වැඳුම් පිදුම් කිරීම සඳහා ගොඩ නංවා ඇති විහාරාංගයකි. මෙය ශාරීරික චෛත්‍යය යනුවෙන් හැඳින්වේ.

**■ බෝධීන් වහන්සේ**

අනිමිස ලෝචන පූජාවෙන් බුදුරජාණන් වහන්සේගේ පවා උපහාර ලැබූ පූජනීය වස්තුවකි. බුදුරජාණන් වහන්සේ පරිභෝජනය කොට ඇති නිසා මෙය පාරිභෝගික චෛත්‍යය නම් වේ.

**■ විහාර මන්දිරය**

බුදුරජාණන් වහන්සේ වෙනුවට ඉදිකොට ඇති පිළිම වහන්සේ වැඩ සිටින්නේ විහාර මන්දිරයේය. බුදුරජාණන් වහන්සේ උදෙසා ඉදිකළ වස්තුවක් බැවින් මෙය උද්දේසික චෛත්‍යය නමින් හඳුන්වනු ලැබේ.

**■ ධාතු මන්දිරය**

විහාරස්ථානවල වැඩ සිටින සර්වඥ ධාතූන් වහන්සේ සහ රහත් ධාතූන් වහන්සේලාද පූජනීය වෙනත් වස්තූන්ද තැන්පත් කොට ඇති ස්ථානය වේ.

**■ ධර්ම ශාලාව**

වන්දනාවට පැමිණෙන දායක දායිකාවන්ට පන්සලේ වැඩ සිටින ස්වාමීන් වහන්සේ ධර්මානුශාසනා පවත්වන්නේ මෙම ස්ථානයේදීය.

**■ ඝණ්ටාර කුලුන**

බුදුරජාණන් වහන්සේ උදෙසා පැවැත්වෙන ශබ්ද පූජාවට අවශ්‍ය ඝණ්ටාරය සවිකොට ඇති දර්ශනීය කුලුනකි. ගම්වැසියන්ට යම් යම් පණිවුඩ ලබාදෙන මාර්ගයක් වශයෙන්ද මෙය නම් කෙරේ.

**■ ලැගුම් ගෙය හෙවත් ආවාසය**

අපට අවවාද අනුශාසනා කරන භික්ෂූන් වහන්සේ වැඩ සිටින ස්ථානය මේ නම්.

**■ පුස්තකාලය**


භික්ෂූන් වහන්සේලාට බොහෝ පොත්පත් කියවා ඇසූ පිරූ තැන් ඇතිව බහුශ්‍රැත තත්ත්වයට පත්වීමට ඇතැම් විහාරස්ථානවල මෙය දක්නට ලැබේ.

**■ සීමා මාලකය**

උපසම්පදා කිරීම, කඨින චීවරය පැවැරීම වැනි විනය කර්ම පැවැත්වීම සඳහා මෙය සාදා ඇත.

**■ මලසුන් ගෙය**

පුද පූජාවන් පැවැත්වීම සඳහා පැමිණෙන උපාසක උපාසිකාවන් මල්, පහන්, ගිලන්පස ආදිය සකස් කරන්නේ මෙහිය.



**■ සක්මන් මළුව**

භාවනා කරන භික්ෂූන් වහන්සේගේ ප්‍රයෝජන සඳහා යොදාගන්නා ස්ථානයකි.

**■ විහාර අංගණය හෙවත් මළුව**


පින්කම් සඳහා විහාරස්ථානයට රැස්වන පින්වතුන් බොහෝ විට රැඳී සිටින්නේ සිසිල් සුළං හමන මළුවේය.

ප්‍රේමසිරි මුණසිංහ

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"

# "පටිච්ච සමුප්පාදය"

## හරිහැටි තේරුම් ගනිමු



බුද්ධත්වයෙන් පළමු සතිය විමුක්ති සුවයෙන් ගත කළ බුදුරජාණන් වහන්සේ සත් වන දින රාත්‍රියෙහි පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ බව මහාවග්ග පාලියෙහි සඳහන් වෙයි. එම පටිච්ච සමුප්පාදය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. එය බෞද්ධ හේතුඵලවාදය ලෙසද හඳුන්වනු ලැබේ. දුක ඇතිවීම හා නැතිවීම පිළිබඳ බෞද්ධ විග්‍රහය පැහැදිලි කරන්නේ පටිච්ච සමුප්පාදයෙනි. එය ගැඹුරු දහමකි. එය අවබෝධ නොකරන තාක් කල් ප්‍රජාව වැරදි දෘෂ්ටිවලට බැස ගන්නා බවත්, ඒ නිසාම සසරින් එතෙර වීමට නොහැකි වන බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එසේම යමෙක් පටිච්ච සමුප්පාදය දකියි නම් හෙතෙම ධර්මය දකින බවත්, යමෙක් ධර්මය දකියි නම් හෙතෙම පටිච්ච සමුප්පාදය දකින බවත් දේශනා කර ඇත. එබැවින් එහි ගැඹුරු වූත්, විශිෂ්ට වූත් ධර්මය පිළිබඳව යම් ප්‍රමාණයක හෝ අවබෝධයක් ලබාගැනීමට උත්සාහ දැරීම අතිශයින් වැදගත් වෙයි. පටිච්ච සමුප්පාදයන්ගෙන් අදහස් කරන්නේ සහේතුක බවයි. සප්‍රත්‍ය බවයි. අහේතුක අප්‍රත්‍ය නොවන බවයි. එනම් ලෝකයේ වස්තු පුද්ගල සිද්ධි යන සියල්ලක්ම හේතු ප්‍රත්‍යය සම්බන්ධතාවකට අනුව ක්‍රියාත්මක වන බවයි.

අවිජ්ජා නම් ඇත්ත ඇති සැටි නොදැකීමයි. එනම් චතුරාර්ය සත්‍යය නිසි ලෙස අවබෝධ නොවීමයි. සංස්කාර නම් සිතින් කයින් වචනයෙන් කරන පින්, පව්ය. විඥාන නම් මව් කුසක පිළිසිඳ ගන්නා සිතයි. ඒ සිත හා සම්බන්ධ වන වින්දන ශක්තිය ආදී නාමධර්ම හා මූලික රූප කොටස් නාමරූප නම් වෙයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ආදී අරමුණු ගැනීමට සුදුසු පරිදි සැකසෙන චක්ඛු, සෝත, ඝාන, ජිව්හා කාය, මන ආදිය ෂඩායතනයි. ඵස්ස නම් ස්පර්ශයයි. එනම් ඇස ආදී ඉන්ද්‍රියයන් සමග රූපාදී අරමුණුත් ඒ සමගම ක්‍රියාත්මක වන විඥානයත් එකට එකතු වීමයි. ඒ ස්පර්ශය නිසා දැනෙන සැප, දුක් ආදිය වේදනාවයි. තණ්හා නම් ඒ විඥානයන් නිසා රූපාදියට ඇලුම් කිරීමයි. ඇලුම් කිරීම නිසා ඒ අරමුණු දැඩි ලෙස සිතින් ග්‍රහණය කිරීම උපාදානයයි. ඒ නිසා කරන කර්ම භව නම් වෙයි. කර්ම ශක්තිය නිසා නැවතත් ලබන උපත ජාති යන්නෙන් අදහස් කරයි. උපතින් පසු සිදුවන දුක් කීපයක් පහතින් දැක්වෙයි. එනම්, ජරා යනු දිරා යාමයි. මරණ යනු ශරීරයේ බිඳී යාමයි. කරදර, විපත්ති නිසා පසුතැවීම සෝකයයි. වැළපීම පරිදේවයයි. කායික පීඩා දුක්ඛ නමිනුත්, මානසික පීඩා දෝමනස්ස නමිනුත් දැක්වෙන අතර උපායාස නමින් දැක්වෙන්නේ සුසුම්ලන ගතිය හෙවත් සිතෙහි වෙහෙසකර ගතියයි. දුකෙහි ඇතිවීම ලෙස සැලකෙන්නේ මේ සියල්ලේ ක්‍රියාත්මක වීමයි. ඒවායේ නැතිවීම දුකෙහි නැතිවීමයි. මෙම දොළොස් වැදෑරුම් චක්‍රයක් ලෙසට ක්‍රියාත්මක වන්නා වූ උතුම් සත්‍යය සියලු දෙනාටම අවබෝධ වේවා.


ඩී. එම්. වසන්ත සංජීව බණ්ඩාර


"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

මැලිබන් කිරි

# අභයදාන

ගව සම්පත සුරැකීමේ මහඟු සත්කාරය....





අනුරාධපුර අටමස්ථානාධිපති අති පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනාවෙන් පොසොන් පොහොය නිමිත්තෙන් අනුරාධපුර විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ අබියසදී අනුරාධපුර චෛතිහාසික ලංකාරාමාධිපති රළපනාවේ ධම්මජෝති නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්කිරි ගවයින් මරණින් නිදහස් කළ අවස්ථාව.

## 2017 ඇසළ පොහොය වෙනුවෙන් පැවැත්වූ මැලිබන් කිරි අභය දාන වැඩසටහන්


- ස්වාධීන රූපවාහිනිය සමගින් මොණරාගල ඇතිමලේ කොටියාගල වත්තේගම පුරාණ රජමහා විහාරයේදී කිරි ගවයන් 10 දෙනෙකු (2151 - 2160)
- රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය සමඟින් ගිරාදුරුකෝට්ටේ රජමහා විහාරයේදී කිරි ගවයන් 03 දෙනෙකු (2161 - 2163)
- මැලිබන් සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාල සංකීර්ණයේදී කිරි ගවයින් 02 දෙනෙකු (2164 - 2165)

මැලිබන් කිරි අභයදාන වැඩසටහනට සහභාගී වීම සඳහා
සම්බන්ධීකරණ උපදේශක අමතන්න 077 4 558 570

Maliban Kiri

## සිදුහත් කුමරුට මහා අභිනික්මන් කළාසේම තේමිය කුමරුට අභිනික්මන් කළ බව කියැවෙන

# මූගපක්ඛ ජාතකය



සණරාමර වූ මහා කාරුණික සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවෙසෙන සමයෙහි මූගපක්ඛ ජාතක දේශනාව තමන් වහන්සේගේ මහාභිනික්මන අරභයා ගෙනහැර දක්වා වදාළ සේක.

පෙර බරණැස් නුවර 'කසී' නම් රජෙක් දැහැමින් රාජ්‍ය කළේය. ඔහුට සොළොස්දහසක් බිසොවරුන් සිටියාහ. ඒ එක් තැනැත්තියකට හෝ දරු උපත් නොවීය. නුවර වාසීන් එක්ව රජුගේ වංශය රැකීම සඳහා පුතෙකු ප්‍රාර්ථනා කරන්නැයි කීවාහුය. රජුත් ඒ සොළොස්දහසක් බිසෝවරුන්ට පුතෙක් ප්‍රාර්ථනා කරන්නැයි කීවේය. ඒ බිසෝවරුනුත් දෙවියන් පුදා පුතුන් පැතූ නමුත් එක් අයෙකු හෝ දරුවන් නොවැදූහ.

ඒ රජුගේ ශීලාදී ගුණ ධර්මයන්ගෙන් යුක්ත වූ චන්‍ද්‍ර දේවී නම් නම් අගමෙහෙසි බිසවක් සිටි අතර ඒ බිසොවුන්ට ද දරුවෙකු ප්‍රාර්ථනා කරන්නැයි කීහ. එවිට චන්‍ද්‍ර දේවී පුරපසළොස්වක දිනයෙහි පෙහෙවස් සමාදන්ව තමාගේ ශීලය පරීක්ෂා කොට සත්‍යක් ක්‍රියා කොට සත්‍යවාදීව සිල් රකින්නා වූ මා හට දරුවෝ ඇති වේවායි සත්‍යක්‍රියා කළහ. ඇගේ ශීලානුභාවයෙන් සක්දෙව් රජු චන්‍ද්‍ර දේවීන් පුතෙකු පතනා බව ඇයට සුදුසු පුතෙකු බලා දෙව්ලොව සිටි බෝධිසත්වයන්ට එම දේවියගේ කුස උපත ලබන්නැයි කීවෙන්

දෙව්ලොවින් චුත වූ බෝධිසත්වයන් වහන්සේ චන්‍ද්‍ර දේවියගේ කුස පිළිසිඳ ගත්තේය. සෙසු දිව්‍ය පුත්‍රයන් පන්සියයක් දෙනා අනෙක් බිසෝවරුන්ගේ කුස පිළිසිඳ ගත්තාහුය. චන්‍ද්‍ර දේවිය තමන් කුස දරු ගැබක් පිහිටි බව රජුට දන්වූයෙන් ගැබ් පෙරහරක් පැවැත්විණ. ඇය පින්වත් පුතෙකු වැදුවාය.

මෙය ඇසූ රට වැසියෝ සතුටු වූහ. ඒ සතුටට රජතුමා එදින අමාත්‍යවරුන්ට උපන් දරුවන් ගණන් බලා පන්සියයක් කුමරුන් උපන් බව දැන ඒ පන්සියයක් කුමරුන්ට කුමාරාභරණ හා කිරිමවුන් ත්‍යාග කොට දුන්හ. මධුර වූ කිරි ඇති සිවුසැටක් කිරිමවුන් බෝසතාණන් වෙන් කොට දී, චන්‍ද්‍ර දේවියට ද වරයක් දුන්නේය. ඒ චන්‍ද්‍ර දේවිය ද වරය කැමති විටෙක ගන්නෙමැයි කල් දැමුවාය.

නම් තබන දිනයේ කුමරුන්ට මතු උපද්‍රවයක් තිබේදැයි බ්‍රාහ්මණයන්ගෙන් විමසා ඔවුහු මේ පින් ඇති කුමාරයෙකැයි කීහ. මොහු එක් දිවයිනක් පමණක් නොව සතර දිවයිනම පාලනය කරන්නට සමර්ථ වන බව දැන්වීය. මේ කුමරා උපන් දිනයෙහි කසී රට වැසි ලැබුණ හෙයින් ද, රජවැසියන්ගේ සිත් සතුටු කරමින් උපන් හෙයින් ද 'තේමිය' කුමාරයා යැයි නම් තැබුවේය.

අනතුරුව එක් මසක් වූ කුමාරයා සරසා රජුගේ සමීපයට ගෙන ගියේය. රජතුමා තමාට ප්‍රිය වූ පුත්‍රයා වඩා ගෙන සංතෝෂයෙන් ඇකයේ තබාගෙන උන්නේය. එකණෙහිම රජු හමුවට සොරුන් සතර දෙනෙකු ගෙනාවේය. ඔවුන් අතරෙන් එකෙකුට කටුසැමිටියෙන් දහසක් පහර ගැසූහ. එකෙක් ඇල්කීලේ දමවයි කීහ. එකෙකුගේ අත් පා කැපීමට නියම කළේය. එකෙකු උල තබවයි නියම කළේය. මහබෝසතාණන් පිය රජුගේ කුරිරු බස් අසා පියරජු අපායගාමී වෙතැයි මහත් බියට පත් විය.

දෙවන දවසේ සරසන ලද සිරියහනේ සැතපී කුමාරයා පිබිදුනේය. ඇස් ඇර සේසත දෙස බැලූ විට ආශ්චර්යමත් දෙයක් දුටුවේය. ස්වභාවයෙන්ම අකුසලට බිය ඇති ඔහුට ඒ ආශ්චර්ය දැක අධික බියක් උපන්නේය. ඒ කුමරා තමන් කොතන සිට විත් උපන්නේදැයි ජාතිස්මරණ ඤාණයෙන් බලා දෙව්ලොවින් චුතව ආ බව දැන එයින් ඈත ආත්මය බලත්ම නිරයෙහි වැටී පැසුණු බව දුටුවේය. එයිනුත් ඈත බල්නුයේ රාජ්‍ය කරන බව දුටුවේය. තමන් රජ වී කළ අකුසල කර්මයන් නිසා අසූ දහසක් අවුරුදු නරකයේ පැසුණු බව දුටුවේය. ඉදින් මම මතු රාජ්‍යය කරන්නේ නම් නරකයෙහි ඉපිද මහත් දුක් විඳීමට සිදුවෙතැයි සිතුවේය. ඔහුගේ රන්වන් ශරීරය මේ නිසාම නිශ්ශෝභා විය. මේ සිරගෙයක් වැනි මාළිගයෙන් නිදහස් වන්නේ කෙසේදැයි කල්පනා කළේය.


පෙර ආත්ම භවයෙක මේ කුමරුට මව් වූ එක්තරා දෙව්දුවක් කුමාරයා අස්වසා ඔබ මේ රාජ්‍ය සම්පත්තියෙන් මිදීමට කැමති නම් බිහිරෙකු, කනෙකු, ගොළුවෙකු යන මේ අංග තුනෙන් යුතුව, නුවණැති බව සඟවා ජනයාට අඥාන බව දක්වන්න. එවිට රජකම අතහැරදා තාපසව යෑමට ඔබට හැකිවනවා ඇත. රජතුමා කුමාරයට උකටලීව සිටීමට නොහැකි වන පරිද්දෙන් පන්සියයක් පිරිස රඳවා සිටි කල්හි ඔබට නොකැමැති රාජ්‍ය හැර යන්නට අවස්ථාව යෙදෙනු ඇතැයි කීහ. ඒ දෙව්දුව කී පරිද්දෙන් කුමාරයා කටයුතු කළේය. එකල්හි පිය රජ්ජුරුවෝ ඒ කුමාරයාට උකටලීව නොසිටින පරිද්දෙන් පන්සියයක් කුමරුවෝ තැබූහ. ඒ පන්සියයක් කුමරුවෝ කිරට හඬති. මහබෝසතාණන් අපාය බයින් මුසපත්ව අපායගාමී වී රාජ්‍ය කිරීමට වඩා නිරාහාරව සිට මිය යාම වඩා සුදුසු වෙතැයි සලකා කිරට නොහැඬූහ. කිරිමව ඒ බව චන්‍ද්‍ර දේවියට කී විට චන්‍ද්‍ර දේවිය රජුට දැන්වූවාය.

රජ්ජුරුවෝ නිමිති දන්නා බ්‍රාහ්මණයින් කැඳවා ඊට හේතු විචාළේය. බමුණෝ, දේවයන් වහන්ස, කුමාරයාට කිරිබොන වේලාව ඉක්මවා කිරි දෙන්න කීහ. සෙසු දරුවන් මහ හඬින් හඬන නමුත් කුමාරයා නොහඬන්නේය. නොනිදන්නේය. බෝසත් කුමාරයා පළාපල ද නොගත්තේය. කෙළි සෙල්ලම් ද නොකළේය. අපාය බියෙන් බයපත්ව නිශ්චලවම සිටියේය. අට හැවිරිදි වියට පත් කුමරුවා, නළුනාටක බැලීමට වත් නොගියේය. දසහැවිරිදි වියේදීත් බිහිරි බව පෙන්වීය. මල මූත්‍ර කොට එහිම සැතපෙන්නේය. මෙසේ නොයෙක් දුක් විඳිමින් රජවීමට වඩා දහස් ගණනින් දුක් විඳ නිශ්චලව ඉවසා සිටීම දුටු මව් පියෝ ළය පැලී යන්නාක් සේ ශෝකයට පත් වූහ. මව්පියෝ, තොප ප්‍රාර්ථනා කොට ලත් පුතෙකි. අප නොනසන්න. දඹදිවෙහි රජුන්ගෙන් එන නින්දාවෙන් අප මුදවන්නැයි කීහ. එහෙත් නිශ්චලව වැතිර සිටියේය.

මෙසේ සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි සොළොස් මහා පරීක්ෂාවන් හා කුඩා පරීක්ෂාවන් ද සිදු කොට කිසිවක් දැන ගත නොහැකි වූ තැන පිය රජතුමා යළිත් වරක් නිමිති බමුණන් ගෙන්වා, පුතු උපන් කල්හි ඔබලා පින් ඇති කුමාරයෙකුයි පැවසූහ. එය ඇසූ නිමිති බමුණෝ මෙම කුමාරයා රජගෙහි සිටිය හොත් ඔබතුමාට උපද්‍රව වන්නේය. එහෙයින් මොහු අවමංගල්‍ය රථයක හිඳුවා බැහැර කිරීම යහපතැයි කීහ. චන්‍ද්‍ර දේවිය එය අසා මහත් ශෝකයට පත්ව රජුගෙන් පෙරදී පොරොන්දු වූ වරය ඉල්ලා සිටියාය. එවිට රජු චන්‍ද්‍ර දේවියගෙන් ඔබට කැමති වරය දැන් ගන්නැයි කීවේය. දේවිය මගේ පුත්‍රයාට රාජ්‍ය දෙන්නැයි කීවාය. එවිට රජු, ඔබේ පුතු කාලකණ්නියෙකි, එබැවින් රාජ්‍ය නොදෙමි. එසේ නම් සත් අවුරුද්දකට දෙන්නැයි ඉල්ලා සිටියාය. මේ ආදී වශයෙන් සත්දින දක්වා ඉල්ලා සිටියාය. අනතුරුව චන්‍ද්‍ර දේවිය තේමිය කුමාරයා රාජ්‍යාභරණයෙන් සරසවා ඇතු පිට තබාගෙන සේසත මුදුනත් කරවා නුවර පැදකුණු කර පැමිණි විට සිරියහනේ සතපවා මගේ ළය පැළෙන්නාක් වැනිය, මා අසරණ නොකරන්නැයි ඇයැද සිටියාය.

සත්වෙනි දවස රජතුමා සුනන්ද නම් රථාචාර්යා අමතා තම පුතු අමුසොහොනක ලෑමට නියෝග කළේය. අවසානයේ ඒ රථාචාර්යයා බෝසත් කුමරා අවමංගල්‍ය රථයෙහි ලා අමුසොහොනට ගෙන ගොස්, වළක් සාරා, කසී රජුගේ පිළි වූ, ගොළු, බිහිරි වූ, සිත් පිත් නැත්තා වූ මොහු වළලමියි සිතා බැහැරට ගෙන

ගියේය. දොළොස් ගව්වක් ගිය ඔහු සුපිපුණු වන ලැහැබක් අමුසොහොනකැයි සිතා එතන වළලන්නට වළක් කණින්නට විය. වළ කණිමින් සිටින විට තේමිය කුමාරයා දිව්‍ය පුත්‍රයෙක් සේ නැගිට පැමිණ රථාචාර්යයාගෙන් වළක් සාරන්නේ කුමටදැයි විමසීය. එබස් ඇසූ රථාචාර්යයා කසී රජුගේ ගොළු වූ, බිහිරි වූ, සිත් පිත් නැති පුතා වළලන අදහසින් වළ සාරමියි කීය. එවිට කුමරා මම ගොළු හෝ බිහිරි හෝ කොර පිළි හෝ නොවෙමි. මගේ අත්සඟල බලව. මගේ



මියුරු තෙපුල් අසවයි පැවසීය. ඒ ඇසූ රථාචාර්යයා කුමරා දෙස බලත්ම ශක්‍ර දේවේන්ද්‍රයාගේ දිව්‍ය පුත්‍රයෙකු සේ දැක ඔබ කවරෙක්දැයි විමසීය. මම ඒ කිසිවෙක් නොවෙමි. තේමිය කුමාරයා නම් මමය. ඔබට බත් දෙන රජු සැතපෙන රුකක් වැනිය. මම ඒ රුකෙහි ශාඛාවක් වැනිය. ඔබ ඒ රුක් සෙවනේ සැතපුණු එකෙක් වැනියැයි පැවසීය. එසැණින් අදහා නොගත් රථාචාර්යයා දේවානුභාවයෙන් කුමරුගේ කථාව අදහාගත් විට, කුමරා, මම සොළොස් අවුරුද්දකින් මනෝරථය පූරණය වූ තැනැත්තෙක්මියි කී කල්හි, රථාචාර්යයා, තේමිය කුමාරයාණන් වහන්ස, මධුර වූ තෙපුල් ඇති ඔබතුමා ගොළු වූයේ කවර හේතුවක් නිසා ද? බිහිරි වූයේ කෙසේ ද? පිළි වූයේ කෙසේ දැයි විචාළේය. පූර්ව ජාතියේ විඳි දුක් දැක බියට පත්ව මම රාජ්‍යාභිෂේකයෙන් පුදතැයි සිතා මවුපිය දෙදෙනා සමග කථා නොකර තපසට යෑමට වීර්ය කළෙමි.


සත්වයා අකුසලින් විඳිනා දුක් දැක දුකෙන් මිදෙමියි සිතා සොළොස් අවුරුද්දක් ගිය තැන මගේ මනෝරථය පූරණය කර ගතිමි. සුනන්ද රථාචාර්යයා ද කුමාරයාගේ දහම් කථා අසා සසරේ ඇති දුක දැන ඔබතුමන් සමග පැවිදිවීමට මටත් අවස්ථාව දෙන්නැයි ඉල්ලීය. එවිට බෝසතාණන් වහන්සේ, ඔබ නුවරට නොගොස් සිටිය හොත් තේමිය කුමරා යක්ෂයෙකැයි ද, රථාචාර්යයා ඔහු විසින්ම මැරුම් කා ඇතැයි ද සිතාගත් විට නින්දාවක් පැමිණෙන්නේය. ඔබටත් මටත් ඇතිවන නින්දාව නැති කර ගැනීම සඳහා අසුන් හා රථය ද රැගෙන නුවර කරා ගොස් රජුට මේ තොරතුර දන්වා අසුනක් දී රජුට දැන්වීමට පිටත් කර යැවීය. රථාචාර්යයා බෝසතුන්ගේ පා වැඳ පැදකුණු කොට නුවර මාළිගා දොරකඩට පැමිණියේය.

පෙරමග බලා සිටි චන්‍ද්‍ර දේවිය රථාචාර්යයාගෙන් මගේ පුත්‍රයා නැසුණේ ද? ඔහු සැබැවින්ම ගොළුවෙක් ද? කොරෙක්ම ද? වළක් සාරා යට කළෙහිද? මේ සියල්ල නොවළහා කියන්න යැයි පැවසුවාය. එවිට රථාචාර්යයා, තේමිය කුමාරයා ගොළු හෝ බිහිරි හෝ නොවන්නාහ. මිහිරි කථා ඇත්තාහ. බණ කියන්නාහුය. එසේ නම් කවර හෙයින් කැඳවාගෙන නොආවේදැයි විමසූ විට ඔබ වහන්සේ මට අභය ලබා දෙන්නේ නම් මා දුටු දෙය නොවළහා කියමි. අභය දෙන්නෙමැයි කී විට සියලු තොරතුරු දැන්වීය. කසී රජු ද සුනන්දගේ බස් අසා මහාසේනගුත්ත නම් අමාත්‍යයා කැඳවා මංගල රථය ගෙන්වා කුමරු සොයා ගියේය. කුමරු වෙත පැමිණි රජු ද, බෝසතුන් කළ ධර්ම දේශනාව අසා ශීල සමාදානයේ පිහිටා රාජ්‍යය හැර මහණ විය. මෙසේ රජ්ජුරුවෝ තුන් දෙනෙක් රාජ්‍යය හැර මහණ වූහ. සියලු තාපසවරු අෂ්ටසමාපත්ති උපදවා මරණින් මතු බඹලොව උපන්හ.

මහණෙනි, මම මේ ජාතියෙහි මෙන්ම පෙර ජාතියෙත් මහාභිනික්මන් කළෙමියි වදාරා චතුස්සත්‍ය දේශනා කොට තේමිය ජාතකය නිමවා වදාළ සේක. එකල සේසතේ වාසය කළ දිව්‍ය ස්ත්‍රිය උත්පලවර්ණ ස්ථවරීයයි. රථාචාර්යයා නම් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේය. තේමිය කුමාරයාගේ මවුපිය දෙදෙනා නම් මහාමායා දේවිය හා සුද්ධෝදන රජතුමාය. එකල පර්ෂදය නම් බුද්ධ පර්ෂදයයි. ඒ මූගපක්ඛ පණ්ඩිතයෝ නම් ලොව්තුරා බුදු වූ සම්බුද්ධ රාජෝත්තමයන් වහන්සේමය. මෙම උතුම් ඇසළ පොහෝ දිනයෙහි ජීවිතයේ අනිත්‍යභාවය සලකා ශීලයෙහි පිහිටා චතුස්සත්‍ය ධර්මය අවබෝධ කර ගැනීමට වෑයම් කරමු.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."



# උදාර බෞද්ධ වනිතාවන්

**සිදුහතුන්** බිහි කළ
මහාමායා දේවිය ඔබයි.
දින හතෙන් මිය ගියද
ඔබ ගියේ තව්තිසා දෙව්ලොමටයි.
බුදුරදුන් විජම් බණ දෙසා
සසර කතරින් එතෙර කළ
බුදුරජුනි, මේ උතුම් කළගුණයි,
මව දුකින් මුදවාලීමයි,
බුදු සිරිත එසේමයි.

අප බෝ සතුන්ගේ සුළු මවත්,
ජනිත කළ මවත්
මාරුවෙන් මාරුවට,
භව පන්සීයක් පුරාවට
පතාගෙන ආ සුළු මව
මහා ප්‍රජාපතී ගෝතමියයි.
බුදු කෙනකු නැලවූ, පෝෂණය කළ
එකම එක මාතාව ප්‍රජාපතී ගෝතමියයි.

සම්බුදු අවසර පරිදි පිරිනිවීමට පෙර
රහත් තෙරණින් අතරින්
ඉර්දි දැක්වූයේ ඔබයි.
නම, රුව මෙන් දහස් ගණනක් මවා,
ගුරුලකු මෙන් අහසේ පියඹා,
සිංහයකු ලෙස සර්ජනා කර,
සද්ධන්ත ඇතෙකු ලෙස
බුදු පාමුල වැඳ වැටුණේ ඔබයි.
ගෝතමිය වන්නේ ඒ නිසයි.

පන්සියයක් බවම
මහ බෝසතුන් හට
බිරිඳ වශයෙන් ඉපිද,
බුදුනුවන්ට උදව් කළ,
බුදුවන තෙක්ම එක බිරිඳ
ඔබ යශෝධරාවයි.
ඉපදුණු හැම භවයකදීම
සුළු වචනයකින්වත්
සිත නොරිදා බුදු බවට පත් කළේ
ඔබ යශෝධරාවයි.
පන්සිය පනස් ජාතක පොතෙහි එන
කතාවක් අනුව දරුවන් දන් දීලත් ඉවසූ,
රාහුල කුමරු ඉපදුණ දා හැර ගිය බෝ
සතුන් වෙත
මෙත් සිතින් ඉවසා,
එම සසුනේ නිවී සැනසුණ
රාහුල මව ඔබ යශෝධරාවමයි.

බුදු වන්ට දිරි දුන් සුජාතාවනි,
ඔබ කිරිපිඬු පුද කළේ බුදුවන්ට දුන් දානයයි.
ඒ කිරිපිඬු වළඳා
උතුම් බුදු බවට ශක්තිය දුන්නේ
සුජාතාවෙනි ඔබ සුජාතාවමයි.

මිගාර මාතා නම් වූ විශාඛාවනි,
ඔබ සම්බුදු සසුනේ බැබැළෙන
උතුම් විශාඛාවමයි.
බුදුනට පමණක් නොව සියලු සඟ රුවනටම
ඇප උපස්ථාන කර පිදුවේ පූර්වාරාමයයි.
මේළ පළඳනාව විකුණා
කළ ආරාමය
සඟ සතු කළේ ආරාම පූජාවයි.
විශාඛාවනි ඔබගේ චරිතය
දෑ හෙළ කතුන් හට
උතුම් වූ දායාදයයි.

කොසොල් රජු මල්ලිකා දේවිය
උපතින්ම ගුණවත්ය, නැණවත්ය.
කිසිවෙකුටවත් නොදෙවෙනි වන
අසදෘශ මහා දානය දුන්නු ආකාරය,
ඇතුන් පන්සීයක් ඡත්‍ර ඔසවා වඩින
මහා සඟරුවන දර්ශනීය දර්ශනයයි.

දරුවන් නැති බැවින් මව්පිය වෙත යන
ඇය බුදුරජුන් වෙත ගිය විට
දරුපල ඇත යන්න ආපසු හිමි වෙත යන්න
ජෝඩු වශයෙන් දාසයයි,
කුමරුවන් තිස් දෙකයි.
රජ අණ පරිදි තම පියා සමග පිටත් වූයේ
කොල්ලකරුවන් මෙල්ල කිරීමටයි,
ආපසුඑන විටදී කරුමයක මහත,
රජුගේ උපක්‍රමයට අසුවී
සිය පුතු තිස් දෙදෙනාම මියගිය
පුවතින් නොසෙල්වුණු ඔබ,
දානය එලෙසින්ම සඟ රුවනට
පූජා කළ ඔබ, සෝවාන් වූ මල්ලිකාවමයි.
මෙය පුදුම ඉවසීමයි, සැනසීමයි.

සිහින් සිරුරක් ඇති
මල පුතකු අතට ගෙන
සරණක් සොයා බුදුන් වෙත ගිය
ඇයට නොමල ගෙයකින්
අබ මිටක් ගෙන එන්නට දුන් .
පරීක්ෂණයෙන් නොමැරෙන අය
නැති බව වටහා ගත් ඇය
බුදු සරණ ගොස් මරණය කෙළවර කරගත්
කිසාගෝතමිය ඔබ ලද සැපය
නිවන් සැපයමයි.

මරණ භයකගේ විලාපය ගැන
නොසන්සුන් සිත නිරුවතින්
කළ පිනකටදෝ බුදුරජුන් වෙත
ගිය කල නැගෙණියනි සිහි ගන්න
කියූ පමණින්, සන්සුන් වී මරණයෙන්
කෙළවර නැවත උපතක් නැති
සදාකාලික නිවන
අවබෝධ කරගත් පටචාරාවයි.

මරණසතිය සසර පුරුදු කළ
ඇය පෙහෙකම්හලට යන විටදී
බුදුරදුන්ගෙන් බණ ඇසීමට ගිය කල
ඔබ කොහි සිට ආවෙහිද?
කොහි යන්නෙහිද?
දන්නෙහිද? නොදන්නෙහිද?
නැවත දන්නවාද?
යන ප්‍රශ්නවලට පිළිතුරු දී සමත් වූ
ඇත තිසරණයෙහි පිහිටා
මරණ ධර්මතා වැඩීමෙන්
නිවන් දුටු
ඇය වාසනාවන්ත පෙහෙකාර දියණියයි.

මල්දම් රැගෙන එන
කුජ්ජුත්තරාවගෙන් බණ අසා
ධර්මයට පැහැදුණු සාමාවතී බිසව
රජ බිසව මාගන්දියගේ උගුලට අසුවූවත්
සතර වටින් ගිනි ඇවිලෙන කල
අනෙක් ස්ත්‍රීන් සමග මෛත්‍රිය වඩා
දිව්‍ය ලෝකයේ උපත ලද ඔබ
සාමාවතී සමග සිටි පිරිසයි.
මරණ සිත මෙන් සිතක් නම්
දිව්‍ය උපත නියමයක්මයි.

කාමයෙහි වරදවා හැසිරුණු අම්බපාලී
සසුනට පැහැදුණු සුකුමල මාලී
බුදුන් සරණ ගොස් නිවනට වන් පාලී
අඹ වනයක් සසුනට පූජා කළ අම්බපාලී
රූපය නිසා මදයට පත් ඛේමා
නන්දා, එලෙස විය රූපෙට අන්දා
දෙදෙනාම යොමු වුණේ බුදු රුව දුටු හින්දා
රූපය අනිත්‍ය බව දැනගත් හින්දා
නිවන් සැපය දෙන්නාමත් ලැබගත්තා
මෙලෙසින් බුදු සසුනේ සුවය ලැබූ
තරුණියන් ගණන කොපමණදැයි කියනු බැරී
ථේරී ආපදා එහි එන සියලු දෙනා
තෙරුවන් සරණ ගොස් තිබුණිය
නිවනටම සදා

**දෑල ශුද්ධා සිල් මාතාව - අසේකා සිල් මාතා අසපුව - තලවතුගොඩ**




"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



# මහ රහතුන් පවා වැඩ සිටි රුහුණේ පුංචි සීගිරිය වඳින්නට යමුද?

දකුණු පළාතේ ඇති ඓතිහාසික පුද බිම් අතර මුල්කිරිගල නොහොත් මුල්ගිරිගල රජමහා විහාරස්ථානයට හිමිවන්නේ සුවිශේෂ වූ ස්ථානයකි. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල නගරයේ සිට කිලෝමීටර් 20 ක් පමණ ඔබ්බෙන් මෙම විහාරස්ථානය පිහිටා ඇත. තංගල්ල වීරකැටිය මාර්ගයේ හෝ තංගල්ල බෙලිඅත්ත මාර්ගයේ ගමන් කිරීමෙන් පුද බිම වෙත ළඟාවිය හැකිය. ග්‍රාමීය පරිසරයක් ශෝභමාන කළ මුහුදු මට්ටමින් අඩි 300 ක් පමණ උස්වූ කඳු මෙවුලක් ආශ්‍රයේ මෙම ලෙන් විහාරය ගොඩනංවා තිබීම නිසාද, මෙය වන්දනාමාන කරන පින්වතුන්ට මෙන්ම සොඳුරු ඉසව්වන් සොයා පියනගන සංචාරකයකුටද කදිම පරිසරයක් නිර්මාණය කරදී තිබේ. ක්‍රි.පූ. 2 වන සහ 1 වන සියවස්වලදී මෙම පර්වතයේ පිහිටා ඇති ලෙන් තුළ ''භාණක'' හිමිවරුන් වැඩ සිටි බවට විහාරස්ථානයේ දක්නට ලැබෙන ශිලාලේඛණ සාක්ෂි දරයි. ''භාණක'' හිමිවරුන් යනුවෙන් හැඳින්වෙන්නේ බුදුරදුන් වදාළ උතුම් සද්ධර්මය සියලු බාධක අභිමුව කටපාඩමින් සුරැකිව පවත්වාගෙන ආ සැරියුත් මහරහතුන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටය. භාණක පරපුරේ මජ්ඣිම නිකාය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමේ වගකීම හිමි ''මජ්ඣිම භාණක'' නම් වූ හිමිවරුන් මෙහි වැඩ සිට ඇති බවට ශිලා ලේඛණය සාක්ෂි සපයයි. මෙය ඇතුළු වෙනත් සාධක රාශියක්ම පදනම් කරගනිමින් මෙම අසිරිමත් පුදබිමෙහි අතීතයේදී රහතුන් වහන්සේලා වැඩ හිඳි බව විද්වත් විශ්වාසයයි.

ස්වභාව ධර්මය දායාද කළ ශෛලමය ලෙන් කුටි හතක් සහිත මහල් පහකින් සමන්විත කඳු ගැටය එදා රජ දරුවන් විසින් ජාතික ආගමික උරුමයක් බවට පරිවර්තනය කරමින්, එයට අපූරු නිර්මාණාත්මක හැඩතලද එක්කර ඇත. අව්‍යාජ ස්වභා සෞන්දර්යයේ ගිරිකුළ මුල්ගිරිගල නමින් හැඩ වැඩ කර ඇත්තේ පවතින ස්වාභාවික පරිසරය චමත්කාරයෙන් ඔදවත් කරලමිනි.



මෙය බොදු ජනතාව උදෙසි තිළිණ කළ අපූර්වත්වයෙන්, සුන්දරත්වයෙන් පිරිපුන් තවත් අභිමානවත් බෞද්ධ උරුමයකි. මුල්ගිරි ගල වෙත එන වන්දනාකරුවකුට එය ආගමානුකූල අපූරු අඩවියකි. ලොව අටවැනි පුදුමය ලෙසින් විශ්ව සම්භාවනාවට පාත්‍ර වූ සීගිරිය ඓශ්චර්යවත් නිර්මාණයකි. එවන් සීගිරි ආලකමන්දාව මතකයට නංවමින් මුල්ගිරිගල හඳුන්වන්නේ රුහුණේ පුංචි සීගිරිය නමිනි. එයම මෙහි වන සුවිශේෂී ස්වභාවය, කලාත්මක භාවය හඳුනා ගැනීමට හැකි පෙළඹුමක් ඇති කරවන සුළුය.

ජනප්‍රවාද සාධක සහිත සද්ධාතිස්ස රජු (ක්‍රි.පූ. 137-119) මෙකී ප්‍රදේශයේ දඩයමේ යන විට විහාරයක් ඉදි කිරීමට යෝග්‍ය භූමියක් බව වැද්දෙකු විසින් පෙන්වා දුන් නිසාවෙන් මූ කිවූ ගල වූ භූමිය මුල්ගිරගල නම්වූ බව කියැවේ. එමෙන්ම මෙම විහාරය හක්මන උමංගල හා උමගකින් සම්බන්ධ බවත් නා රජෙකු විසින් නිර්මාණය කළ බවටත් ජනප්‍රවාද වේ. හත්වන සියවසට අයත් මුල්කිරිගල ශිලා ලේඛණයේ සාධක මත මෙම විහාරය එකල සම්භාව්‍ය තත්ත්වයේ පැවැති බව තහවුරු වේ. 12 වන සියවසට අයත් මානාභරණ රජුගේ කටගමුව ශිලා ලේඛනයේ ''තලා මුහුද්ගිරි විහාරය'' වශයෙන් හඳුන්වන විහාරය මෙකී විහාරය බව පිළිගැනේ. ක්‍රි.පූ. 2 වන සියවසේදී කාවන්තිස්ස රජු කරවූ බවට වංශ කථාවේ සඳහන් සමුද්ගිරි විහාරය මෙය විය හැකි බවටද අදහස් ඉදිරිපත් වී ඇත.

මුල්කිරිගල විහාරයේ ආරම්භය පිළිබඳව නිශ්චිත මත ඉදිරිපත් වී නැතත් අවට ලෙන් පද්ධතිය හා විහාරය ඉදි කිරීමට ගෙන ඇති පරිශ්‍රමය අනුව පැහැදිලි වන්නේ ඓතිහාසික යුගයේ සිටම මහා රාජ්‍ය අනුග්‍රහයක් ලද භූමියක් බවය. මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේදී මෙකී විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කොට ලෙන් කිහිපයක් මහනුවර සම්ප්‍රදායේ පහතරට ශෛලියේ සිතුවමින් අලංකාර කර ඇත. ලන්දේසි අවධියේ මෙම

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''

විහාරය අඩම්ස් බර්ග් නමින් හැඳින්වූ බවටද සාධක වේ. විහාරයේ පිහිටි ඉහළ රජමහා විහාර මළුවෙහි වූ ක්‍රි.ව. 10 වන සියවසට අයත් ශිලා ලේඛනයෙහි මෙම විහාරස්ථානය මුහුදුන්ගිරි ලෙස හඳුන්වා තිබේ. පර්වතයට එක් පසෙකින් මුහුද දිස්වීම මීට හේතුසාධක වී ඇති බව විශ්වාස කෙරේ.

බෝධිවංශයට අනුව මෙම විහාරය ගිරිබා විහාරය ලෙසත්, එසේම සමහර ස්ථානයන්හිදී දක්ඛිණගිරි විහාරය ලෙසත්, යුරෝපීය වාර්තාවන්හි දක්වෙන අයුරින් මෙම විහාරය ඇඩැම්බර්ක් ලෙසත් හඳුන්වා තිබේ. මහනුවර යුගයේදී මෙම විහාරස්ථානය මූලගිරි විහාරය යනුවෙන් විස්තර කොට ඇත. එසේම සද්ධාතිස්ස රජ විසින් මෙම විහාරය වෙනුවෙන් සුදුසු භූමියක් සොයනා කාලයේ වැද්දෙකු විසින් මෙම ස්ථානය පිළිබඳ ලබාදුන් තොරතුරු අනුව රජු පිරිස සමග මූ කිවූ ගල (වැද්දා කියූ ගල) බැලීමට පැමිණ සතුටු සිත් ඇතිව විහාරය කරවූ බව පැවැසෙයි. එතැන් පටන් විහාරය මූ කිව් ගල විහාරය ලෙස හැඳින්වූ බව විස්තර වේ.


මෙය විහාර සංකීර්ණයකි. ලෙන් විහාර 7 ක්, දාගැබ් 3 ක්, බෝධීන් 3 ක් සහ කටාරම් කොටන ලද ලෙන් 11 ක් හා ශිලා ලේඛන මෙන්ම පැරණි ගල් කණු, ශෛලමය ඔරු, ශෛලමය මලසුන් මෙහි ඇති පෞරාණිකත්වයටත්, ආගමික අභිමානවත් බව සුරැකීමට සබැඳිව අදත් නටබුන් වෙසින් පෙනී සිටියි. එසේම විහාර බිතු මත ඇඳි සිතුවම් පෙළ මහනුවර සම්ප්‍රදායේ රුහුණු ආභාෂයේ කලා කෘතීන්ය. ඒ අතර තේලපත්ත ජාතකය පෙරහර ජවනිකාවල බෙරකරුවන්ගේ සිතුවම් විශේෂ තැනක් ගන්නා බව කලා විචාරකයන්ගේ මතයයි. ඒ අතර වන බෙරයක් වයන කාන්තා රුව විශේෂ අවධානයක් දිනාගන්නා ලද අපූරු සිතුවමක් වශයෙන් හඳුන්වයි. රුහුණට ආවේණික මකර තොරණ, දොරටුපාල රූපාදියද, විහාර මැදුරු විචිත්‍රවත් කරවයි. විහාරයේ පිහිටි ඉහළ රජමහා විහාර මළුවෙහි වූ ක්‍රි.ව. 10 වන සියවසට අයත් ශිලා ලේඛනයෙහි මෙම විහාරස්ථානය මුහුදුන්ගිරි ලෙස හඳුන්වා තිබේ. පර්වතයට එක් පසෙකින් මුහුද දිස්වීම මීට හේතුසාධක වී ඇති බව විශ්වාස කෙරේ.

ඊට අමතරව පර්වත විහාරයේ උඩහ මළුවේ පිහිටා ඇති බෝධිය දෙතිස්ඵලරුහ බෝධීන් වහන්සේ නමක් බව සනාථ වී හමාරය. බෝධි වංශයට අනුව එකල මෙම විහාරය 'ගිරිබා විහාරය' නමින් හඳුන්වන ලද බව පැහැදිලිය. මෙම ප්‍රදේශයට 'ගිරුවාපත්තුව' යන නම යෙදෙන්නට මෙම විහාරස්ථානය ප්‍රධාන හේතු කාරණාවක් වූ බව ප්‍රකට අදහසකි. මෙම විහාරස්ථානයේ අභිවෘද්ධිය වෙනුවෙන් මහානාග, කාවන්තිස්ස, සද්ධාතිස්ස, වළගම්බා (වට්ටගාමිණී අභය), දප්පුල යනාදී රජවරුන් මෙන්ම මහනුවර යුගයේදී රාජ්‍යත්වය දරූ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාද වෙහෙස වී ඇති බැව් ඉතිහාසයේ සඳහන්ය.

මෙම විහාරස්ථානයේ සැබෑ නාමය මුල්කිරිගලද, මුල්ගිරිගලද යන්න සමහරුන් ප්‍රශ්න කරති. ශාස්ත්‍රපති මැදගොඩ සිරිනිවාස ස්වාමීන් වහන්සේ අර්ථ දක්වන පරිදි මෙම විහාරස්ථානයේ නියම නාමය විය යුත්තේ 'මුල්කිරිගල' යන්නයි. කෙසේ වෙතත් අතීතයේදී එය 'මූලගිරි විහාරය' යන නමින්ද හඳුන්වා ඇත. බෝධිවංශයට අනුව මෙම විහාරය ගිරිබා විහාරය ලෙසත්, එසේම සමහර ස්ථානයන්හිදී දක්ඛිණගිරි විහාරය ලෙසත්, යුරෝපීය වාර්තාවන්හි දක්වෙන අයුරින් මෙම විහාරය ඇඩැම්බර්ක් ලෙසත් හඳුන්වා තිබේ. මහනුවර යුගයේදී මෙම විහාරස්ථානය මූලගිරි විහාරය යනුවෙන් විස්තර කොට ඇත.

එසේම සද්ධාතිස්ස රජ විසින් මෙම විහාරය වෙනුවෙන් සුදුසු භූමියක් සොයනා කාලයේ වැද්දෙකු විසින් මෙම ස්ථානය පිළිබඳ ලබාදුන් තොරතුරු අනුව, රජු පිරිස සමග මූ කිවූ ගල (වැද්දා කියූ ගල) බැලීමට පැමිණ සතුටු සිත් ඇතිව විහාරය කරවූ බව පැවැසෙයි. එතැන් පටන් විහාරය මූ කිව් ගල විහාරය ලෙස හැඳින්වූ බව විස්තර වේ. මුල්කිරිගල විහාර සිතුවම් පෙළ මහනුවර සම්ප්‍රදායට අයත් රුහුණු ආභාෂයේ කලා කෘතීන් වන අතර තේලපත්ත ජාතකය පෙරහර ජවනිකාවල බෙරකරුවන්ගේ සිතුවම් විශේෂ තැනක් ගනී. බෙරයක් වයන කාන්තා රුව විශේෂ අවධානයක් දිනා ගන්නා ලද විශිෂ්ට ගණයේ සිතුවමක් වශයෙන් හඳුන්වයි. රුහුණට ආවේණික වූ මකර තොරණ, දොරටුපාල රූප මෙහි දක්නට හැකිය. දක්ෂ නිර්මාණ ශිල්පියකු වූ දෙවරම්පල සිල්වත් තැන මෙහි සිතුවම් ප්‍රතිසංස්කරණයට දායක කරගෙන ඇති බව කලා විචාරකයන්ගේ මතයයි.

**එම්. ජී. ඒ. අමාලි අනුරුද්ධිකා**
**ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**



"ධර්ම දනය සියලු දනයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."



# ශ්‍රී සිද්ධාර්ථ රතනසාර නාහිමි ගුණානුස්මරණ ධර්ම ශාලා මන්දිරය විවෘත කෙරේ

**අපවත්වී** වදාළ මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික මැණික්දිවෙල ගනේමළුව පුරාණ සහ ඓතිහාසික වල්ගම්පාය රජමහ විහාරයන්හි අධිපති, පූජ්‍ය දෙහිදෙණියේ ශ්‍රී සිද්ධාර්ථ රතනසාර නාහිමි ගුණානුස්මරණය කිරීම් වස් නිමකරන ලද ශ්‍රී සිද්ධාර්ථ රතනසාර නාහිමි ගුණානුස්මරණ ධර්ම ශාලා මන්දිරය මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය අනුනායක දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්ම නාහිමි විසින් විවෘත කළ අවස්ථාව ඡායාරූපයේ දැක්වේ.

## වාහලනාග නාමයෙන් උපසම්පදාව ලබති



**මහනුවර,** අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක, කුරුණෑගල ඇත්කඳ රජමහා විහාරාධිපති, ආණමඩුවේ සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සි නාහිමි සහ අස්ගිරිය මහා විහාරයීය කාරක සංඝ සභාවේ කාරක සභික කර්මාචාර්ය වදුරාගල ධම්මාරම, ඇත්කඳ රජමහා විහාරාධිකාරී වීරපොකුණේ සුමංගල, තුන්හිටියාවේ රේවත, විද්‍යාවේදී අනුරාධපුරයේ අරියධම්ම, සම්බෝධි විහාරාධිපති, බෞද්ධයා නාලිකාවේ අධ්‍යක්ෂ දරණගම කුසලධම්ම යන හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන්, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක
අස්ගිරිය විහාරවාසී උඩුගම සරණතිස්ස සාමණේර නම් පොසොන්පුර පසළොස්වක දින අස්ගිරිය මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී වාහල නාග නාමයෙන් පසුගියදා උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබූහ.

## වාහලනාග නාමයෙන් අධිශිල් ලබති



**මැණික්හින්න,** හූරිකඩුව ගල්පිහිල්ල රජමහ විහාරය, උඩගම වටගොඩේ ශ්‍රී බෝධිරාජරාම පුරාණ විහාරය, වේරපිටිය බුලුවේතැන්න සිද්ධාර්ථාරාමය, කුණ්ඩසාලේ කිතුලේතැන්න රත්මල් විහාරය යන විහාරයනහි අධිපති, මල්වතු මහා විහාරයේ ගල්පිහිල්ල පන්සලේ භාරකාර, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ශාසන ආරක්ෂක මණ්ඩල අංක එක කලාපයේ ලේඛකාධිකාරී, විශ්‍රාමික විදුහල්පති, සාමවිනිසුරු, ශාස්ත්‍රපති උඩුගොඩ ශ්‍රී ධම්මකන්ධ දෙදුම්බර ප්‍රධාන අධිකරණ සංඝනායක හිමිපාණන්ගේ ශිෂ්‍ය, දැනට මහනුවර, අස්ගිරිය මහා විහාර මහ පිරිවෙනේ ප්‍රාචීන පණ්ඩිත උපාධිය සඳහා පෙනී සිටි පල්ලේකැලේ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලබන මැණික්හින්න හුරීකඩුවේ ගල්පිහිල්ල රජමහ විහාරස්ථ ශ්‍රී විද්‍යාලෝක පිරිවෙනේ පරිවෙනාචාර්ය රඹුක්වැල්ලේ නන්දාරාම ශිෂ්‍ය නම මල්වතු මහා විහාරයේ මංගල උපෝසථාගාරයේදී වාහල නාග නාමයෙන් අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබූහ.

## මහනුවර තරුණ බෞද්ධ සංගමයට නව නිලධාරීහු පත්වෙති

**මහනුවර** තරුණ බෞද්ධ සංගමයේ ඉදිරි වර්ෂය සඳහා පත්කරන ලද නව නිලධාරී මණ්ඩලය මෙසේය. ප්‍රධාන සභාපති එම්. කේ. ටී. එල්. සරත් මුණවීර, ප්‍රධාන ලේකම් එස්. බී. එම්. උපුල් ප්‍රියන්ත පෙරේරා, භාණ්ඩාගාරික එච්. එම්. එන්. ඒකනායක, උප සභාපතිවරුන් වික්‍රම බී. පී. තෙන්නකෝන්, ඩී. ඩබ්ලිව්. එච්. එම්. අබේකෝන්, සරත් කුමාරසිංහ, ඒ. සිරිල් ද සොයිසා, අජිත් උපුල් මුණසිංහ, උප ලේකම් අංජන විදානගේ, ගණන් පරීක්ෂක යසපාල වනසිංහ, ප්‍රචාරක නිලධාරී එල්. උපාලි වෛද්‍යරත්න, සංස්කාරක ඒ. ඒ. මුණසිංහ යන මහත්වරු දාහත් දෙනකුගෙන් යුත් කාරක සභාවක්ද මෙහිදී පත්කර ගනු ලැබීය. භාරකාර මණ්ඩලය සභාපති එම්. කේ. ආර්. තිලකරත්න, ලේකම් ඉන්දික ප්‍රේමදාස යන මහත්වරු.

**කේ. බණ්ඩාරනායක**

**සඳහම් ප්‍රහේලිකාව 106 සහ ජයග්‍රාහකයන් පිළිබඳ විස්තර ලබන කලාපයේ පළවෙ**

## දිවමන් බුදු සමිඳු වැඩ ගමු නුවර ගිහින්

මහ නාහිමිවරුන් රජ මැතිඳුන් රකින
බොදු මහ සඟ රුවන සැදූහෙන් වැඳ පුදන
ලෝ වැසි බොදු දනන් නැමදා පින් ලබන
දළදා සමිඳු වැඩ ගමු පතමින් නිවන

කළිඟු රටේ ගුහසිව රජුගෙන් තිළිණ
කිත්සිරිමෙවන් මහ රජිඳුන් පිළිගැනුණ
රජ දූ පුත් දෙපළ දෝතින් වැඩමවූන
දිවමන් සමිඳු වැඩ ගමු නුවරට ගොසින


රජකම සුරැකුමට රැකගත යුතු රුවන
දළදා සමිඳු ලෙස එකලදි පිළි ගැනුන
රජ දහනත් සම්පතුත් සැම පුද දෙමින
දළදා සමිඳු සුරැකී රජු පණ ලෙසින

සිරිලක බොදු අපට පෙර පින් ඇති හින්දා
කළිඟු රජිඳු අප වෙත සෙනෙහස රන්දා
දූන් දළදා හිමිට බුදු මාළිග බන්දා
සුරැකු පිදූ සැම නිවනට යති කැන්දා


මහනායක සමිඳු අනුනායක සමිඳු
ගරුතර සඟරුවන මහ නිලමේ පැහැදූ
යස බොදු සිරිත් වත් පිළිවෙත් කර නැමදූ
විස්මිත නුවර පෙරහර ලොව විය පසිඳූ

බුදු දම් සඟරුවන තෙරුවණ වැඩ සිටින
දළදා සමිඳු රැක පුද පිළිවෙත් පුරන
මහනා හිමිවරුන්ගෙන් ආසිරි ලබන
හෙළදිව බුදු සසුන සුරැකේ තිර ලෙසින

**විමල් රූබසිංහ**
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යංශයේ හිටපු ලේකම්**



"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# හද පිරි බැතියෙන් දළදා මාළිගාව නමින් ඔබේ පරිත්‍යාගය mCash සමඟින්

mCash එසැණින් මුදල්

## ඔබ mCash පාරිභෝගිකයෙක් නම් :

- #111# අමතන්න
- Option 4 - Aayathanika Geweem තෝරන්න
- Option 3 - Parithyaaga තෝරන්න
- Option 1 - Sri Dalada Maligawa තෝරන්න
- mCash PIN අංකය ඇතුළත් කරන්න
- දුරකථන අංකය ලෙස ඔබේ ජංගම දුරකථන අංකය ඇතුළත් කරන්න
- පරිත්‍යාග කිරීමට කැමති මුදල ඇතුළත් කරන්න
- SMS පණිවිඩයකින් ගනුදෙනුව තහවුරු කෙරේ

## ඔබ mCash පාරිභෝගිකයෙක් නොවන්නේ නම් :

- ළඟම සිටින mCash අලෙවි නියෝජිතයා හමුවන්න
- ශ්‍රී දළදා මාළිගාවට ඔබ මුදල් පරිත්‍යාගයක් කරන බව සඳහන් කරන්න
- ඔබේ දුරකථන අංකය සමඟ පරිත්‍යාග කරන මුදල සඳහන් කරන්න
- අදාළ මුදල mCash නියෝජිතයාට ලබා දෙන්න
- SMS පණිවිඩයකින් ගනුදෙනුව සහතික කෙරේ

**භාවිත කිරීම සඳහා #111# අමතන්න**

වැඩි විස්තර සඳහා 7111 අමතන්න නැතිනම්
www.mobitel.lk/mCash වෙත පිවිසෙන්න.

සරලව
සුරක්ෂිතව
සැණෙකින්

දුරකථන ජාල හවුල්කරුවන්

Sri Lanka Telecom Mobitel

etisalat


mCash එසැණින් මුදල්

# මහනුවර ඇසළ පෙරහර මංගලයයේ කප් සිටුවීම ජූලි 24 වැනිදා

මහනුවර ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන ශ්‍රී නාථ, ශ්‍රී විෂ්ණු, ශ්‍රී කතරගම, ශ්‍රී පත්තිනි යන සිව් දේවාලයන්හි වාර්ෂික ඇසළ පෙරහර මංගලයය මෙම වර්ෂයේ (2017) වනාහි කටක රවි විසිහතර භාග වූ චන්ද්‍ර මාස ක්‍රමයෙන් නිකිණි මස පුර පෑලවිය නම් තිථිය ලත් සඳු දින ශුද්ධ සූරයෝදයාදි පැය දෙක (2) පසුවී විනාඩි 25 ට හෙවත් ව්‍යවහාර වර්ෂයෙන් 2017 වැන්නෙහි ජූලි මස 24 වැනි සඳු දින පෙ.ව. හය (6) පසුවී විනාඩි 58 ට උතුර දිශාභිමුඛව සිරිත් පරිදි පේ කොට තබන ලද 'පරාස' වෘක්ෂයේ ශාඛාවක් ගෙන මහනුවර සිව් දේවාලයන්හි ප්‍රධාන කොට ඇති සියලු විහාර දේවාලයන්හි පූර්වාභිමත්ව ඇසළ 'කප්' සිටුවීම සුබ බව මහනුවර ඇසළ පෙරහර 2017 සම්බන්ධව ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා විසින් නිකුත් කර ඇති නිවේදනයෙහි දැක්වෙයි.

එම විස්තරයට අනුව ජූලි 29 වැනි දින කුඹල් පෙරහරද, අගෝස්තු 3 වැනි දින රන්දෝලි පෙරහරද, අගෝස්තු 7 වැනි දින දියකැපුම් පෙරහරද, අගෝස්තු 8 වැනි දින සිරිත් පරිදි දවල් පෙරහරද පැවැත්වේ.

කේ. බණ්ඩාරනායක





## කුකුළෑදෑගොඩ රංගිරි පුරාණ විහාරයේ අභිනවයෙන් ඉදිකළ විහාරාංග සඟසතු කොට පූජා කෙරේ





වසර 30 කට ආසන්න කාලයක් කිසිදු සංවර්ධන කටයුත්තකට ලක් නොවූ මධ්‍යම පළාතේ යටිනුවර කුකුළෑදෑගොඩ රංගිරි පුරාණ විහාරයේ අභිනවයෙන් ඉදිකළ විහාරාංග සඟසතු කොට පූජා කිරීමේ පුණ්‍ය මහෝත්සවය සියම් මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් අනුනායක නියංගොඩ ශ්‍රී විජිත සිරි අභිදාන අනුනාහිමිපාණන් වහන්සේ හා ගරුතර මහා සංඝරත්නයද, ස්වර්ණවාහිනී ඇතුළු ඊ.ඒ.පී. සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂිකා දීපා එදිරිසිංහ මැතිනිය ඇතුළු සම්භාවනීය ගිහි පැවිදි අමුත්තන්ගේ සහභාගිත්වයෙන් පසුගියදා සිදු කෙරුණි.

කෝට්ටේ පදිංචි "Top Level Performance", "Thasuki International" අධිපති, ව්‍යාපාරික උෂාන් පෙරේරා මැතිතුමා විසින් චෛත්‍යරාජයාණන් වහන්සේද, හෝමාගම ව්‍යාපාරික විශ්‍රාමලත් පාඨශාලාධිපති, බන්දුමතී කුරුප්පුආරච්චි මැතිනිය විසින් විහාර මන්දිරයද, හෝමාගම "New Karunarathne Stores" අධිපති පී. ඒ. කීර්ති කරුණාරත්න මහත්මා විසින් අලංකාර බෝධි ප්‍රාකාරයද, නුගේගොඩ "Grace Cosmatics" අධිපති, ඉංජිනේරු කමල් පෙරේරා මැතිතුමා විසින් ධර්ම ශාලා ගොඩනැගිල්ලද, තවත් බොහෝ පින්වතුන් රාශියක් සංඝාවාසය, වලාකුළු බැම්ම, දොළොස් මහා පහන ඉදිකිරීමටද දායක වී ඇත. සිව්සල් බුද්ධ ප්‍රතිමා වහන්සේට මුල්ගල් තැබීමද උත්සවයට සමගාමීව සිදු කෙරිණ. පේරාදෙණිය මහ රෝහලේ හිටපු අධ්‍යක්ෂ, විශේෂඥ වෛද්‍ය එච්. එම්. හේරත් මැතිතුමා ඒ සඳහා මූලිකත්වය ගෙන ඇත.

වත්මන් විහාරාධිපති, විචිත්‍ර ධර්ම කථික පූජ්‍ය මහදිවුල්වැව මහින්ද නාහිමපාණන් වහන්සේගේ අවවාද අනුශාසනා මත විහාරස්ථානයේ සියලු සංවර්ධන වැඩ කටයුතු සිදුකෙරේ.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

# මහනුවර නගරයටම බෞද්ධාලෝකය විහිදුවන **අස්ගිරි මහසෑරජුන්**






සෙංකඩගලපුර ඓතිහාසික අස්ගිරි මහා විහාරයට අයත් මහා විහාර පිරිවෙනේ අභිනවයෙන් නිර්මාණය කොට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා විවෘත වූ අස්ගිරි මහසෑරජුන්, කන්ද උඩරට සෙංකඩගලපුරවරයට පැමිණෙන දෙස් විදෙස් සැමගේ නෙත්සිත් බුදු බැතියෙන් පුබුදුවාලන සුවිශේෂී නිර්මාණයකි.

එහි චෛත්‍ය ගර්භය තුළ නිර්මාණය කොට ඇති අලංකාර විසිතුරු ලී කැටයම් හා රමණීය බිතුසිතුවම් පැරණි බෞද්ධ කැටයම් හා බිතුසිතුවම් කලාවේ සනාථන උරුමය කියාපාන විශ්ව නිර්මාණයන්ය.

ඉපැරණි ස්ථූප කලාවේ සියලු අංග මැනවින් සුරකිමින් රටට දායාද කළ අස්ගිරි මහසෑරජුන් රටට උරුම කර දෙනු ලැබූයේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ කාරක සංඝ සභික නියෝජ්‍ය ලේඛකාධිකාරී අස්ගිරි මහා විහාර පරිවේනාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය නාරම්පනාවේ ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. උන්වහන්සේ ලක්දිව ප්‍රචලිත අස්ගිරි මහා විහාර පිරිවෙනෙහි පරිවෙනාධිපතීන් වහන්සේ වශයෙන් නවක ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට සුදුසු නේවාසිකාගාර හා වෙනත් භෞතික පහසුකම් මෙන්ම භාෂා ශාස්ත්‍ර හා ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩිදියුණු කරමින් අනාගත සසුන බැබළවීම සඳහා ශික්ෂාකාමී විනයග රුක උගත් භික්ෂූන් වහන්සේලා හදාවඩා පෝෂණය කර ගැනීමට ගන්නා වෙහෙස මහන්සිය කාගේත් පැසසුමට ලක් වේ.

මෙම අසිරිමත් අභිනව චෛත්‍ය රාජයාණන් වහන්සේ නිර්මාණය කොට සසුනට දායාද කිරීමෙන් කන්ද උඩරට නයනාභිරමණීය පරිසරය තවදුරටත් ශෝභාමත් කිරීම කාගේත් සොම්නසට හේතු වේ.

**කේ. මීගහකුඹුර**



ලොකෙකනාථ වදනම්බුජ රාජහංසං
වෙනෙය්‍ය කොමුදවනං කිර ජොතයන්තං
සෙට්ඨං මහග්ඝ වරරූප විරාජමානං
වන්දාමි වාමමමලං ජිනදන්ත ධාතුං

(දන්ත ධාතුන් වහන්සේ වඳින ගාථාව)



පින් සිතින් මුද්‍රණ දායකත්වය
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ තුමා විසින් ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක් හවුස්) මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.